# නැවත පැමිණීම,
# නැවත පදිංචිකරවීම,
# පුනරුත්ථාපනය
# සහ
# සංවර්ධනය
# සඳහා
# වෘත්තියෙහි නියැලියන්ගේ උපදේශන
# කට්ටලය

## ක්‍රියාත්මකවීම් සඳහා කැඳවුම්

## න්‍යාය පත්‍රය


**මානුෂීය සේවායතන සමූහය (CHA)**

**සහ**

**අභ්‍යන්තර අවතැන්වූවන් පිළිබඳ බෲකින්ස් ආයතනයේ**

**එස්.ඒ.අයි.එස් ව්‍යාපෘතිය.**

ප්‍රකාශණය :

**මානුෂීය සේවායතන සමූහය (CHA)**
10 කින්සි ටෙරස්
කොළඹ 08
ශ්‍රී ලංකාව

දුරකතන/ෆැක්ස්: 94-11-4610943/4
Email :jeevant@sri.lanka.net / cha_info@sri.lanka.net
Website: www.humanitarian-srilanka.org

සහ

**බෲකින්ස් – අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ SAIS ව්‍යාපෘතිය**
1775 මැසචුසෙට් මාවත NW
වොෂින්ටන් DC 20036

දුරකථන : 202-797-6218
ෆැක්ස් : 202-797-6003
Website : www.brook.edu

පළමු සහ මුළාරම්භක ප්‍රකාශණය - මාර්තු 2004

මෙම ප්‍රකාශණය ඉංග්‍රිසි, සිංහල සහ දෙමළ භාෂාවලින් ලබා ගත හැකිය.

සියළුම හිමිකම් ඇවිරිණි. වෙනත් අයුරින් ප්‍රකාශයට පත්කළ නොහැක. කෙසේ වුවද, අලෙවිය සඳහා හැර ඉගැන්වීම් කටයුතු සඳහා මෙහි කොටස් ඕනෑම අයුරකින් ප්‍රතිනිර්මාණය කළ හැක. වෙනත් තත්ත්වයන් යටතේ පිටපත් කිරීමට හෝ වෙනත් ප්‍රකාෂණයන් තුළ පාවිච්චි කිරීම / පරිවර්තනය කිරීම / යොදාගැනීම සඳහා ප්‍රකාශකගේ පූර්ව ලිඛිත අවසරය ලබා ගත යුතුය.

**ISBN: 955-1041-02-X**

සිංහළ පරිවර්තනය - නීල් හේරත්

# පටුන

පිටුව


පෙරවදන 1

තොරතුරු මුලාශ්‍ර සහ උපයෝගී කර ගනු ලැබූ ලිපි ලේඛණ 3

**පළමු කොටස** 5

පසුබිම 5

වෘත්තියෙහි නියැලියන්ගේ උපදේශන කට්ටලය කුමකටද ? 7

"අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්" - අර්ථ දැක්වීමක් 8

අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ මූලධර්ම 8

නැවත පැමිණීම, නැවත පදිංචි කරවීම සහ යලි ඒකාබද්ධ කිරීම 8

පළමු තේමාව - සුරක්ෂිත සහ ගෞරවාන්විත තත්ත්වයන් මත ස්වේච්ඡාවෙන් ආපසු යැවීම. 9

දෙවන තේමාව - නැවත පැමිණීම සැලසුම්කරණය සහ කළමනාකරණය සඳහා හවුල් සහභාගීත්වය 9

තෙවන තේමාව - සහභාගීත්වයේදී සහ ප්‍රවේශයේදී වෙනස්කොට නොසැලකීම සහ සමානාත්මතාවය 10

සිව්වන තේමාව - දේපල ආපසු ලබාගැනීම හෝ වන්දි ලබාගැනීම 11

පස්වන තේමාව - මානුෂවාදී සංවිධානයන්ගේ ප්‍රවිෂ්ඨය 12

වැඩ සටහන් ප්‍රතිචාර සඳහා ප්‍රජාමුල දෘෂ්ඨි කෝණයක් 13

පළමු තේමාව - පවුල් හා ප්‍රජා සම්බන්ධතා සංරක්ෂණය 14

දෙවන තේමාව - ස්ව - උපකාර ක්‍රමෝපායන් සඳහා සහාය වීම 17

තෙවන තේමාව - අවතැන්වූවන්, ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කර ගැනීමෙහිලා බලගැන්වීම 17

සිව්වන තේමාව - තීරණ ගැනීමේදී අවතැන්වූවන් සම්බන්ධකර ගැනීම 18

පස්වන තේමාව - ස්ව-ශක්තිය ප්‍රවර්ධනය කිරීම 20

අවතැන්වීම් කෙළවරවන්නේ කවරදාද ? 21

**දෙවන කොටස** 23

ශ්‍රී ලංකාවට විශේෂිතවූ කරුණු සහ ක්‍රියාත්මකවීම් සඳහා කැඳවුමක් 23

වැළැක්වීම 23

ආරක්ෂාව 25

ඉඩ කඩම් 28

ලිපි ලේඛන 29

නිධාන හේතු කාරක ආමන්ත්‍රණය කිරීමේදී ප්‍රතිපත්තිමය සලකා බැලීම් 30

පරිසරය 31

මානුෂවාදී සහය 32

කාන්තාවන් සහ ළමයින් 33

සම්බන්ධීකරණය 36

ආර්ථිකය සහ සංවර්ධනය 38

ප්‍රතිපෝෂණය සහ අධීක්ෂණය 39

**තෙවන කොටස** 40

නිගමනය 40

ඇමුණුම්

1 ක්‍රමවේදය 42

2 උපදේශන 43

## නැවත පැමිණීම, නැවත පදිංචිකරවීම, පුනරුත්ථාපනය සඳහා වෘත්තියෙහි නියැලියන්ගේ උපදේශන කට්ටලය

# පෙරවදන

නැවත පැමිණීම, නැවත පදිංචිකරවීම සහ පුනරුත්ථාපනය සඳහා වෘත්තියෙහි නියැලියන්ගේ උපදේශන කට්ටලය, මානුෂීය සේවායතන සමූහය (CHA) විසින් ඉමහත් සතුටින් හඳුන්වා දෙනු ලබයි. මෙහි මුල් අදහස වූයේ වෘත්තියෙහි නියැලියන්හට ප්‍රයෝජනවත්වූ මෙවලමක් සැලසුම්කොට, සංවර්ධනය කර ප්‍රකාශ කිරීම වුවද, මෙම ගොණු කිරීම "ක්‍රියාත්මකවීම් සඳහා කැඳවුම් න්‍යාය පත්‍රයක්" ලෙසින් සංවර්ධනය වනු ලැබීය.

මට්ටම් දෙකකදී ප්‍රධාන ක්‍රියාකාරකයින් සමඟ සිදුකරන්නට යෙදුන උපදේශන ක්‍රියාවලියකින් මෙහි ක්‍රමවේදය (පළමු ඇමුණුම) සමන්විත වන්නේය. මින් එක් ක්‍රියාවලියක් පර්යේෂණ උපදේශකයකු විසින් මෙහෙයවන ලද්දාවූ, සහ ප්‍රාදේශීය නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධානයන් සහ දෙමල පුනරුත්ථාපන සංවිධානය සමඟ සිදුකළාවූ සංවාදයන් සහිතව වූ ක්ෂේත්‍ර මට්ටමේදී සිදුකරණු ලැබුවකි. අනෙක වනාහි රජයේ නිලධාරීන්, සරණාගතයන් සඳහාවන එක්සත් ජාතීන්ගේ මහ කොමාසාරිස් (UNHCR), මානව හිමිකම් කොමිසම සහ රාජ්‍ය නොවන සංවිධාන කණ්ඩායම් සමඟ, ඉහළ මට්ටමකදී පවත්වනු ලැබූ රැස්වීම් තුලින් සිදුකරණ ලද්දකි. (දෙවන ඇමුණුම)

උපදේශනයන් තුළින්, පැහැදිලිවූ කරුණක් වන්නේ, නැවත පැමිණීම, නැවත පදිංචි කිරීම සහ සංවර්ධනය සංකීර්ණ ප්‍රශ්ණ සම්බන්ධවූවක් බව සහ අර්බුදයෙහි ඉතා දිගු සහ කල් ඉකුත්වූ ස්වභාවයන් හේතුවෙන් ශ්‍රී ලංකාවෙහි අත්දැකීම් ඊටම අනුපමවූ ගති ලක්ෂණ වලින් යුක්ත බවය. ඉතා රුදුරු සහ විනාශකාරී යුද්ධමය තත්ත්වය තුලින් වඩාත්ම වේදනාවට ලක්වූයේ ඉතා දිගුකාලයක් තිස්සේ ලද අප්‍රසන්න අත්දැකීම් සහිත සාමාන්‍ය ජනතාවය. එම නිසා ප්‍රකෘති තත්ත්වයට යලි පත්වීම සඳහා නිශ්චිත කාල රාමුවක් තුළදී, අනන්තවූ අවශ්‍යතාවයන් සමුදායක් සඳහා ලබාගත හැකි සීමිත සම්පත් පිරිමසා ගත හැකි, සාකල්‍යවාදී ප්‍රවේශයක් අවශ්‍ය වන්නේය. මෙම අවශ්‍යතාවේදී 2006 වසර වන විටදී අවතැන්වීම් වලට අවසානයක් දැකීම අපේක්ෂා කෙරේ.

**මානුෂීය සේවායතන සමූහය (CHA)**
**කොළඹ, ශ්‍රී ලංකාව.**
**නොවැම්බර් 2003**

මානුෂීය සේවායතන සමූහය (CHA) විසින් සංවර්ධනය කරනු ලැබුවාවූ "වෘත්තියෙහි නියැලියන්ගේ මෙවලම් කට්ටලය" ශ්‍රී ලංකාවෙහි අවතැන්ව සිටින්නාවූ ජනයා නැවත පැමිණීම, නැවත පදිංචි කරවීම සේම ජනවාර්ගික අර්බුදයට මූලික වශයෙන් හේතු පාදකවූ කරුනු ආමණ්ත්‍රනය කිරීම සඳහා ක්‍රියාත්මක වීමේ සැලසුම් පිටපතක් සපයයි. එය අවතැන්වීම් සඳහා සේම අවතැන්වීම් වලට ලක් වන්නාවූ ජනතාවන්ට අත්විඳින්නට සිදු වන්නාවූ බලවත් පීඩාවන්ටද අවසානයක් ගෙන ඒම සඳහා වන සංකල්පමය සහ ප්‍රායෝගික මෙවලම් සපයනු ලබයි. එය අවතැන්වූවන් පිළබඳව කටයුතුවල නියැළී සිටින්නාවූ සියළුම අය හට, අවතැන්වීම් වලට සාර්ථක අවසානයක් ගෙන ඒම සඳහා අවශ්‍ය වන්නා ක්‍රියාදාමයන් හඳුනා ගැනීමට සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා උපකාරී විය යුතුය. මෙය ඉමහත් ප්‍රශංසාවට ලක් වියයුතු, රාජ්‍ය හා රාජ්‍ය නොවන ක්‍රියාකාරකයින් මගින් ක්‍රියාත්මක විය යුතු මුලාර්මභයකි.

**ෆ්‍රැන්සිස්. එම්. ඩෙන්ග්,**
**අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් සඳහා වන**
**එක්සත් ජාතීන්ගේ මහලේකම් නියෝජිත**

මානුෂීය සේවායතන සමූහය (CHA) විසින් දක්ෂ අයුරින් කෙටුම්පත් කරන ලද මෙම "වෘත්තියෙහි නියැලියන්ගේ මෙවලම් කට්ටලය" අවතැන්වීම් සඳහා සාර්ථක අවසානයක් ගෙන ඒම සඳහා අවශ්‍යවන්නාවූ පියවර ගණනාවක් සපයමින් සිය කැමැත්තෙන් ආරක්ෂිත සහ තිරසාර ලෙස ආපසු යැවීම් පිළිබඳව වූ ජාත්‍යන්තර සම්මතයන් ශ්‍රී ලාංකීය අත්දැකීම් වලට අනුකූල කර ගනු ලබයි. උදාහරණයක් ලෙස, එය ඉඩම් ගැටළු, දේපල හිමිකම්, සුළු ජන කොටස්වල ආරක්‍ෂාව, අධිකරණ පද්ධතීන් සහ අවතැන්වූවන් සේම රටෙහි සියළුම වැසියන්ට හිමිවන්නාවූ පුළුල් පරාසයක පවත්නා අයිතිවාසියකම් ආදීන් පිළිබඳව අවධානය යොමු කරයි. ගිණිය නොහැකි සංඛ්‍යාවක්වූ අවතැන්වූ පුද්ගලයින් සඳහා එයින් ඉමහත් ප්‍රතිලාභ ගෙන එනු ඇති අතර, අර්බුදයන්ගේ සමථයකට පසු සාමය සහ ස්ථාවරත්වය සඳහා වැදගත්වූ දායකත්වයක් ලෙස ප්‍රත්‍යක්‍ෂ වනු ඇත.

**රොබර්ටා කොහේන්**
**සම අධ්‍යක්‍ෂ**
**අවතැන්වීම් පිළිබඳ**
**බෲකින්ග්ස් ආයතනික එස්. ඒ. අයි.එස්.ව්‍යාපෘතිය**

# තොරතුරු මූලාශ්‍ර සහ උපයෝගී කර ගනු ලැබූ ලිපි ලේඛන

"වෘත්තියෙහි නියැලියන්ගේ උපදේශන කට්ටලය" පහත සඳහන් වටිනා ලිපි ලේඛන වලින් තොරතුරු උකහාගෙන තිබේ.

1 "අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්" සඳහා වන එක්සත් ජාතීන්ගේ මහලේකම් නියෝජිත, ෆැන්සිස්.එම්.ඩෙන්ග් විසින් 1998 වසරේදී ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ මූල ධර්ම (CHA "Guiding Principles on Internal Displacement")

2 අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ මූල ධර්ම පදනම් කොට ගෙන, නෝර්වේජියානු සරණාගත සභාව (NRC), සහ මානව අයිතිවාසිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලය (OHCHR) විසින් සම්පාදිත "අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ මාදිලි" ('Modules on Internal Displacement')

3 "අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ මූල ධර්ම භාවිතය සඳහා අත්පොත".('Handbook for Applying the Guiding Priciples on Internal Displacement'). (මානුෂවාදී කටයුතු සම්බන්ධීකරණය සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලය OCHA සහ අභ්‍යන්තර අවතැන්වීම් සඳහා වූ බෲකින්ස් ආයතනික ව්‍යාපෘතිය, නොවැම්බර් 1999)

4 මානුෂීය සේවායතන සමූහය (CHA) විසින් සම්පාදිත "ප්‍රචලිත කිරීම, අධිචාරනය සහ විශ්ලේෂණය සඳහා මෙහෙයුම් කට්ටලයක්" (A Toolkit for Dissemination, Advocacy and Analysis')

5 ඩේවිඩ්.ඒ. කර්න් විසින් රචිත "අභ්‍යන්තර අවතැන්වීම් අර්බුදය පිළිබඳ හැඳින්වීමක්" (බෲකින්ස්,1998) - (Exodus within Borders)

6 රොබර්ටා කොහේන් සහ ෆැන්සිස්.එම්. ඩෙන්ග් විසින් (බෲකින්ග්ස්, 1998) රචිත The Forsaken People: Case Studies of the Internally Displaced.

7 UNHCR ප්‍රවෘත්ති සඟරාව සහ අනෙකුත් ශ්‍රී ලංකාවට සම්බන්ධ ප්‍රකාශණ

8 "Forced Migration Review" අවතැන්වීම් කෙළවර වන්නේ කවදාද පිළිබඳව වූ මැයි 2003 මුද්‍රණය

ක්‍රියාත්මකවීම් සඳහා කැඳවුමෙහි සැලැස්ම සහ අන්තර්ගතය අවසාන වශයෙන් සංවර්ධනය සඳහා ඉවහල්වූ දර්ශනයන් සහ ඔවුන්ගේ කාලය ලබාදුන් සියළු දෙනාට (දෙවන ඇමුණුමෙහි දක්වා ඇති) අපගේ කෘතඥතාවය විශේෂයෙන් පුදකර සිටිමු. CHA සංවිධානයෙහි විධායක අධ්‍යක්ෂ ජීවන් ත්‍යාගරාජා මහතාගේ මාර්ගෝපදේශකත්වයෙන්, ජීන් සැමුවෙල් මෙනෙවිය (උපදේශක සම්බන්ධීකාරක) සහ රාජ් කුමාර් නාගරාජා මහතා (උපදේශක පර්යේෂක) විසින් මෙම කෘතිය ගොණු කිරීමේ ක්‍රියාවලිය සිදු කරන්නට යෙදුනි.

මානුෂීය සේවායතන සමූහය (CHA) "වෘත්තියෙහි නියැලියන්ගේ මෙවලම් කට්ටලය" සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීමේලා ඔවුන් වෙත ලබාදුන් සහාය වෙනුවෙන් අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ බෲකින්ස් ආයතනික SAIS ව්‍යාපෘතියට කෘතවේදී වන අතර, මෙම කෘතිය පිළිබඳව ඇයගේ ඉතා වටිනා ගුණදොස් විචාර ලබාදීම වෙනුවෙන් එම ව්‍යාපෘතියෙහි සම අධ්‍යක්ෂිකා රොබර්ටා කොහේන් මහත්මිය වෙත විශේෂ ස්තුතිය පුදකර සිටියි.

# පළමු කොටස

## පසුබිම

ශ්‍රී ලංකාවෙහි වසර 20 ක සිවිල් යුද්ධය නිසා දළ වශයෙන් ජීවිත 70,000 පමණ විනාශ විය. 750,000 ට අධික පිරිසක් අභ්‍යන්තරව අවතැන් විය. තවත් 700,000 පමණ රටෙන් පලා ගියහ. 2002 වසරේ පෙබරවාරි මාසයේදී ශ්‍රී ලංකා රජය සහ ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය (LTTE) අතර යුද විරාම ගිවිසුමකට අත්සන් තබනු ලැබීය. කෙසේ වුවද, සාම ක්‍රියාවලිය ඉදිරියට ගෙනයාම සඳහාවු බලවත් අභියෝගයන් හමුවේ කඩිනමින් අවතැන්වීමට ලක්වුවන් යලි පදිංචි කරවීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ අපේක්ෂාවන් අඳුරු විය. යුද විරාමයට පසුව අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් 300,000 කට අධික පිරිසක් උතුරු හා නැගෙනහිර ඔවුන්ගේ වාසස්ථාන බලා ආපසු පැමිණියහ. මීට අමතරව, ඉන්දියාවෙහි සරණාගතයින් ලෙස ජිවත් වූ ශ්‍රී ලාංකීයයන්ද පෙරලා මෙරටට පැමිණීමට පටන් ගත්හ. කෙසේ වුවද, මෙසේ සරණාගතයින් ලෙස ජීවත් වූ ශ්‍රී ලාංකිකයින් ඔවුනගේ මුල් රට කරා ආපසු ඒම සඳහා ඉමහත් මැලිකමක් දක්වනු ලැබීය. කරුණු ගණනාවක් හේතුවෙන් රටට පැමිණි විගසින් ඔවුන්ගේ මුල් වාසස්ථාන කරා යාමට නොහැකිවන නිසා ආපසු මෙහි පැමිණෙන්නාවු සරණාගතයින්ද බොහෝවිට අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් බවට පත්වන බව මෙහිදී සිහි තබාගත යුතුය. 700,000 ක් පමණ රටින් බැහැරව වාසය කරන්නාවු සරණාගතයින් වැඩි සංඛ්‍යාවක් ආපසු මෙරටට පැමිණීමට කැමති නොවන්නේ නම් 500,000 ක් පමණවු පිරිසක් යලි පදිංචි කරවීම සඳහා ඉතිරි වන්නේය. මේ අයගෙන් 125,000 ක් පමණ LTTE පාලනය යටතේ පවතින්නාවු ප්‍රදේශවලින් අවතැන්වූ දෙමළ නොවන අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් වන අතර 50,000 සිට 70,000 පමණ සංඛ්‍යාවක් රජයේ හමුදා යටතේ පවතින්නාවු අධි ආරක්ෂිත කළාප (HSZ) තුළින් අවතැන්වූ දෙමළ පුද්ගලයින් වන්නේය.

වර්ෂ 2002 අප්‍රේල් මාසයේ සරණාගතයින්, පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය පිළිබඳ අමාත්‍යාංශය සහ UNHCR ඒකාබද්ධව සිදුකරන්නට යෙදුන අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් පිළිබඳ ජාතික සමීක්ෂණයකට අනුව ;

**1** සමීක්ෂණය කළ අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් ගෙන් 63% ක් ආපසු ඔවුන්ගේ මුල් වාසස්ථාන කරා යාමට අභිමතය පළ කළහ.

**2** 3% ක් නව ස්ථානකරා යාමට කැමැත්ත පළ කළහ.

**3** 25% ක් ඔවුන් දැනට සිටින ස්ථානයේම රැඳී සිටීමට කැමැත්ත පළ කළහ.

**4** 7% ක් කිසිදු තීරණයක් නොගෙන සිටියහ.

ඉහත සමීක්ෂණයන් තුළින් අවධාරණය වන්නාවූ ලෙසින් ශ්‍රී ලංකා රජයට අනෙකුත් ප්‍රධාන ක්‍රියාකාරයකයින් සමඟ සහයෝගීත්වයෙන් අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්ගේ අවශ්‍යතාවයන් පිළිබඳව වග බලා ගැනීමේ සහ ඔවුන්ට තිරසාර විසඳුම් කරා යාම සඳහා උපකාරී වීමේ වගකීම දැරිය යුතු වන්නේය. මෙම ක්‍රියාවලියේදී LTTE සංවිධානයටද සමහර වගකීම් දැරීම අවශ්‍ය බවද අපේක්ෂා කෙරේ.

අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට ඔවුන්ගේ නිවෙස්වලින් පලායාම හැර වෙනත් විකල්ප නොතිබිණ. කණ්ඩායමක් ලෙසින් ඔවුනට අඛණ්ඩව යම් ඉඩ ප්‍රස්ථා කරා ලඟාවීමේ හැකියාව ඇත්තේය. ඒ සමඟම අවතැන්වූවන්ගේ අත්දැකීම්ද විවිධය. ඔවුන්, ඔවුන්ගේ නිත්‍ය වාසස්ථාන වලින් ඉවත් වීමට හා ප්‍රදේශවලින් පැන යාමට සිදුවීම අවතැන්වූවන් සියල්ලම පොදුවේ අත්විඳි අත්දැකීමක් වුවද, භූගෝලීය පිහිටීම, වාර්ගික පසුබිම, ප්‍රාදේශීය ජනතාව සමඟ ඔවුන්ගේ සම්බන්ධතාව සහ වෙනත් සාධක වලට අනුව ඔවුන්ගේ තත්ත්වයන්ගේ නියතයන් වෙනස් වන්නේය.

පුළුල්වූ ප්‍රභේදයන් සයක අවතැන්වූ පුද්ගලයින් හඳුනා ගෙන තිබේ.

1 අවතැන්ව සුභසාදන මධ්‍යස්ථානවල ජීවත් වන්නන්

2 අවතැන්ව සුභසාදන මධ්‍යස්ථානවලින් බැහැරව ජීවත් වන්නන්

3 ඉන්දියාවේ තමිල් නාඩුවේ සිට ආපසු පැමිණ සංක්‍රාන්ති කඳවුරු (Transit Camp) තුළ ජීවත්වන සරණාගතයින්

4 යලි පදිංචි කරවූ / යලි ස්ථානගත කරණු ලැබූ අය

5 බාහිර රාජ්‍යයන් විසින් ආපසු සිය රටට එවනු ලැබූ සරණාගතයින්, සහ

6 රටෙන් බැහැරව සිටින්නාවූ සරණාගතයින්

ජාතික වගකීම සපුරාලීම උනන්දුකරවීම සහ අභ්‍යන්තරව අවතැන්වූවන්ගේ හිමිකම් සුරැකීම සඳහා පුද්ගල මට්ටමෙන් සහ සාමුහිකව ක්‍රියාත්මකවිම තහවුරු වන්නාවූ අයුරින් මෙම තත්ත්වය පිළිබඳව කටයුතු කිරිමේදී **ක්‍රියාත්මකවීම් සඳහා කැඳවුමක්** අවශ්‍ය කෙරේ. එක්සත් ජාතීන් විසින් පිළිගෙන ඇති "අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ මුල ධර්ම" මෙම ක්‍රියා කාරකම් වලදී පාදක ව්‍යුහය ලෙස භාවිතා කළ යුතුය. මෙම මුල ධර්ම, ක්‍රියාත්මකවීම් සඳහා පොදු පදනමක් සපයමින් රජයන්, රාජ්‍ය නොවන ක්‍රියා කාරකයින්, සිවිල් සමාජය සහ ජාත්‍යන්තර ප්‍රජාව වෙත, අවතැන්වූවන් හට සහාය වීම, සහ ඔවුන් ආරක්ෂා කිරීම සඳහා ඇරයුම් කර සිටී. මෙතුලින් හුවා දැක්වෙන්නාවූ හුදු කැපවීම මෙම **ක්‍රියාත්මකවීම් සඳහා කැඳවුම** තුළින් සාමය සහ සංවර්ධනය කෙරෙහි දායකත්වය ලබා දීමේ හැකියාවන් වැරගන්වනු ලබයි.

නිසැකයෙන්ම, මෙම **"ක්‍රියාත්මකවීම් සඳහා කැඳවුම"** මාර්ගෝපදේශ මූල ධර්ම, ශ්‍රී ලංකාවෙහි විශේෂිතවූ තත්ත්වයනට අනුගත කළ හැකි අයුරින්වූ නිර්දේශිත ක්‍රියාකාරකම් ගොන්නක් බවට පරිවර්තනය කරණු ලබයි. මෙම "කැඳවුම" සම්පාදනය කර ඇත්තේ අභ්‍යන්තරව අවතැන්වූවන් සහ අතීතයේදී හෝ වර්තමානයේදී අර්බුද තුලින් බලපෑම් වලට ලක්වූවන් අරභයාය.

අත්‍යාවශ්‍යයෙන්ම අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් සඳහා වන සහාය තුළ, අවතැන්වීම් මගහැරීම, ආරක්ෂාව සහ දේශපාලනමය, ආර්ථික සහ සමාජීය විසඳුම් අන්තර්ගත විය යුතුය. මානුෂවාදී සහාය සැලසීම, බලපෑම්වලට ලක්ව සිටින්නාවූ ජනතාවගේ භෞතික සුරක්ෂිතභාවය සහ මානව හිමිකම් සඳහා හඬක් නැගීම සහ ඒවා ආරක්ෂා කිරීම සමගින්ම සිදුවිය යුතුය. එය අර්බුදය විසඳීම සඳහා වන දේශපාලනික මූලාරම්භයන් සහ යලි ඒකාබද්ධ කිරීම් සහ සංවර්ධනය සඳහා වන සැලසුම් සමගින් සිදුවිය යුතුය. සැලසුම් කරනු ලබන්නාවූ පිළියම් හුදෙක් හදිසි අවශ්‍යතාවයන් සඳහා වන ප්‍රතිචාරයක් පමණක් නොවිය යුතු අතර ගැටළුව ඇතිවීම සඳහා පාදකවූ තත්ත්වයන් මගහැරීම සඳහා යොමුවිය යුතුය.

## වෘත්තියෙහි නියැලියන්ගේ උපදේශන කට්ටලය කුමකටද ?

වෘත්තියෙහි නියැලියන්ගේ මෙවලම් කට්ටලය සම්පාදනය කරනු ලැබුයේ ; (1) ආපසු යෑමට හෝ යලි පදිංචි වීමට තීරණය කරණු ලැබුවාවූ අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්ට සහාය වීමට, සහ (2) අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් දුෂ්කරතා රහිතව සහ සාමකාමී ලෙස ආපසු යැවීමට සහ යලි පදිංචි කරවීම සඳහා උපකාරී වීමට සහ උනන්දු කරවීමට යොමුව සිටින්නාවූ සත්කාරකයින්ට සහ වෙනත් ක්‍රියාකාරකයින් හට සහාය වීම, සඳහාය. එය මෙම ක්‍රියාවලියෙහි නියුක්තව සිටින්නාවූ සියළු අය හට ප්‍රායෝගික අත්වැලක් වන්නේය. "අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ මූල ධර්ම" මත පදනම්ව ඇති එය විශේෂයෙන්ම, **"නැවත පැමිණීම, නැවත පදිංචි කරවීම සහ යලි ඒකා බද්ධ කිරීම පිළිබඳව වූ මූල ධර්ම"** 28-30, මත පදනම් වන්නේය. කෙසේ වුවද, අදාල අයුරින් උපයෝගී වන්නාවූ වෙනත් මූල ධර්මයන්ද මෙහිදී යොමුවට ගැනේ. මානව හිමිකම් කොමසාරිස් කාර්යාලයෙන් (OHCHR) සහ UNHCR වෙතින්ද, නෝර්වේජියානු සරණාගත කවුන්සිලයේ පුහුණු මවුල තුළ අන්තර්ගතයන් ඇසුරෙන්ද, මානුෂීය සේවායතන සමූහය (CHA) විසින් ප්‍රකාශිත "ප්‍රචලිත කිරීම, අධිචාරනය සහ විශ්ලේෂණය සඳහා මෙවලම් කට්ටලයක්" වෙතින්ද මෙහිදී කරුණු උකහා ගනු ලබයි. මෙහිදී, මෙම ක්‍රියාවලිය සඳහා ප්‍රායෝගික අත්වැලක් කිරීමේ අභිප්‍රායෙන් ක්ෂේත්‍ර යථාදර්ශය ලබාගැනීම සඳහා බලවත් පරිශ්‍රමයක් දරණු ලැබීය. මෙම "වෘත්තියෙහි නියැලියන්ගේ උපදේශන කට්ටලය" ලේඛන ගත කිරීමට පෙරාතුව ඉතා පුළුල් උපදේශන ක්‍රියාවලියක් සහ සියළුම ක්‍රියාකාරකයින් සමගින් සාමූහික රැස්වීමක්ද පවත්වා පොදු එකඟත්වයකට පැමිණෙනු ලැබීය.

# අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් අර්ථ දැක්වීම.

**මූලික සංකල්ප**

විශේෂයෙන්ම, සන්නද්ධ අරගල හේතුවෙන් හෝ ඒ නිසා ඇතිවන අතුරු විපාක මග හැරීම, පොදු ප්‍රචන්ඩකාරී අවස්ථා මග හැරීම, මානව අයිතිවාසිකම් උල්ලංඝණය වීම්, ස්වභාවික හෝ මිනිස් වර්ගයා විසින්ම ඇති කරන්නාවු ව්‍යසන ආදිය හේතුවෙන් හෝ තම නිත්‍ය වාසස්ථාන වලින් බලපෑම් මත හෝ බලාත්කාරයෙන් පලා යාමට හෝ ඉවත්ව යාමට සිදුවන්නාවු, එහෙත් ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලැබූ රාජ්‍ය මායිම් වලින් බැහැරව නොගියාවු පුද්ගලයින් හෝ පුද්ගල කණ්ඩායම් "අභ්‍යන්තරව අවතැන්වු පුද්ගලයින්" ලෙස අර්ථ දැක්වේ.
අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ මූල ධර්ම තුළ අන්තර්ගත අර්ථ දැක්වීමකි (1998)

## අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ මූලධර්ම

**නැවත පැමිණීම, නැවත පදිංචි කරවීම සහ යලි ඒකාබද්ධ කිරීම.**
**(මූල ධර්ම 28-30)**

මූලික සංකල්ප / තේමා

- නැවත පැමිණීම, නැවත පදිංචි කරවීම සහ යලි ඒකාබද්ධ කිරීම, අර්ථ දැක්වීම
- තේමාව
  - සුරක්ෂිතභාවය සහ ගෞරවාන්විත තත්ත්වයන් යටතේ ස්වේච්ඡාවෙන් ආපසු පැමිණීම.
  - ආපසු යැවීම සඳහා අභ්‍යන්තරව අවතැන්වු පුද්ගලයින්ගේ සහභාගීත්වය සහ කළමණාකරනය.
  - වෙනස්කොට නොසැලකීම.
  - දේපල යලි ලබාගැනීම හෝ වන්දි ලබා ගැනීම.
  - මානුෂවාදී සංවිධානයන්ගේ ප්‍රවේශය.

**නැවත පැමිණීම** - කෙනෙකු ඒ අයගේ මුල් වාසස්ථානය කරා ආපසු යැවීමේ ක්‍රියාවලිය අර්ථ දැක්වීම පිණිස යොදා ගැනේ.

**නැවත පදිංචි කරවීම** - (මෙය සරණාගතයින් යලි පදිංචි කරවීමට වඩා වෙනස්ය) රටේ වෙනත් කොටසක නව දිවියක් ආරම්භ කිරීමේ ක්‍රියාවලිය අර්ථ දැක්වීම පිණිස යොදා ගැනේ.

**යලි ඒකාබද්ධ කිරීම** - ඉහතදී අභ්‍යන්තරව අවතැන්වු පුද්ගලයින් ඔවුන්ගේ මුල් වාසභූමිවල හෝ නව වාසභූමිවල පවතින සමාජීය, ආර්ථික, සංස්කෘතික සහ දේශපාලන රටාවන් තුළට යලි ප්‍රවිෂ්ඨ කරවීම සඳහා යොදා ගැනේ.

## පළමු තේමාව : සුරක්ෂිතභාවය සහ ගෞරවාන්විත තත්ත්වයන් යටතේ ස්වේච්ඡාවෙන් ආපසු පැමිණීම

**මූල ධර්ම 28 (1)**

> අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්හට, ස්වේච්ඡාවෙන් තම නිවෙස් වලට හෝ නිත්‍ය වාසස්ථානවලට, සුරක්ෂිතව හා ගෞරවාන්විතව ආපසු පැමිණීම සඳහා හෝ ස්වේච්ඡාවෙන් රටේ වෙනත් ප්‍රදේශයක යලි පදිංචිවීම සඳහා පසුබිම සැකසීම, එසේම පහසුකම් සලසා දීම, නිසි බලධාරීන්ගේ ප්‍රධාන රාජකාරියක් සහ වගකීමක්ද වන්නේය. එවැනි බලධාරීන් එසේ ආපසු පැමිණෙන හෝ යලි පදිංචි කරනු ලබන අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් සමාජ ව්‍යුහය තුළ යලි ඒකාබද්ධ කිරීමට සහාය වීම සඳහා සියළු උත්සාහයන් දැරිය යුතුය.

**ස්වේච්ඡාව** - ආපසු පැමිණීමේ තීරණය ස්වේච්ඡාවෙන් ගනු ලැබුවක් විය යුතුය. මෙම අවශ්‍යතාවය මූල ධර්මයන් අභිබවා යන්නකි. ස්වේච්ඡාවෙන් ආපසු පැමිණීමක් බොහෝ සෙයින් නිත්‍ය හා තිරසාර වුවක් වන්නට ඉඩ ඇත්තේය. මෙයට තෝරා ගැනීමේ නිදහස සහ තතු දැන ගනු ලබන්නාවූ තීරණද සම්බන්ධ වන්නේය.

**සුරක්ෂිතභාවය** - සුරක්ෂිතව ආපසු යෑම වනාහි පහත සඳහන් තත්ත්වයන් යටතේ සිදු වන්නකි.

1. නෛතික සුරක්ෂිතභාවය
2. භෞතික ආරක්ෂාව
3. ද්‍රව්‍ය පිළිබඳ ආරක්ෂාව

**ගරුත්වය** - මෙය සුරක්ෂිතභාවයට වඩා අඩුවෙන් ස්වයං ප්‍රත්‍යක්ෂ වන්නකි. එය ගෞරවාන්විතව සැලකිලි දැක්වීම සහ පිළිගැනීම සහ හිමිකම් පූර්ණ වශයෙන් ප්‍රතිස්ථාපිත කිරීම සම්බන්ධයෙනි.

## දෙවන තේමාව : නැවත පැමිණීම සැලසුම්කරණය හා කළමණාකරණය සඳහා හවුල් සහභාගීත්වය.

**මූලධර්මය 28 (2)**

> අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්ගේ, ආපසු පැමිණීම, යලි පදිංචි කරවීම හා යලි ඒකාබද්ධ කිරීම් සැලසුම්කරණයේදී සහ කළමණාකරණයේදී එසේ අවතැන්වූවන්ගේ පූර්ණ සහභාගීත්වය ලබා ගැනීම සහතික කිරීම සඳහා විශේෂ ප්‍රයත්නයන් දැරිය යුතුය.

"ස්වේච්ඡාත්වය" සහ "ගරුත්වය" යනාදී මූල ධර්ම තුළින් හැඟෙනුයේ ඔවුන්ගේ ආපසු යෑම, යලි පදිංචි වීම සහ යලි ඒකාබද්ධ වීම සැලසුම් කිරීමේදී සහ කළමණාකරණයේදී අභ්‍යන්තරව අවතැන්වූවන්ගේ සහභාගීත්වයයි. අවතැන්වූවන් සම්බන්ධ කර ගැනීම තුළින් ඔවුන්ගේ ආපසු යෑම හෝ යලි පදිංචි වීම වඩාත් සාර්ථක සේම වඩාත් තිරසාර වීමද සිදු වනු ඇත.

## තෙවන තේමාව : සහභාගීත්වයේදී සහ ප්‍රවේශයේදී, වෙනස් කොට නොසැලකීම සහ සමානාත්මතාවය

**මූල ධර්මය : 29 (1)**

> ඔවුන් අවතැන්වීමට භාජනය වීමේ ප්‍රතිඵලයක් ලෙස සිය නිවාසවලට හෝ නිත්‍ය වාසස්ථාන වලට ආපසු පැමිණෙන හෝ රටේ වෙනත් ස්ථානයක යලි පදිංචි කරණු ලැබුවාවූ, අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට වෙනස්කොට නොසැලකිය යුතුය. පොදු කටයුතුවලදී සමාන ලෙස හා පූර්ණ ලෙස සෑම මට්ටමකදීම සහභාගිවීමේ සහ පොදු සේවාවන් සමාන ලෙස භුක්ති විදීමේ අයිතිය ඔවුනට ලැබිය යුතුය.

අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් වෙනස් කොට සැලකීම්වලට නිරාවරණයව ඇති ඉතා පහසුවෙන් පීඩාවට ලක්විය හැකි පිරිස්ය. නීතිය ඉදිරියේ සමානාත්මතාවය පිළිබඳව වූ සංකල්ප, නීතිය සමාන ලෙස සුරැකීම සහ වෙනස්කොට නොසැලකීම, ජාත්‍යන්තර මානව හිමිකම් නීතියෙහි මුරගල් වන්නේය.

වෙනස්කොට නොසැලකීම වඩා වැදගත්වන අංශ

1. "නීතිය අබියස සියළුම පුද්ගලයින් සමාන වේ. නීතියෙන් සමාන ලෙස ආරක්ෂාව පැතීමට සියළු දෙනාටම කිසිම වෙනස්කොට සැලකීමකින් තොරව හිමිකම ලැබේ." (ICCPR හි වගන්තිය 26)
2. අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවාවන් වැනි පොදු සේවාවන්ට ලඟාවීමේ ඉඩ ප්‍රස්ථා
3. පොදු කටයුතුවලට සහ රැකීරක්ෂා සඳහා ලඟාවීමේ ඉඩ ප්‍රස්ථා
4. අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් අතර සිටින පීඩාවන්ට පහසුවෙන් නතුවිය හැකි කාන්තාවන් වැනි කණ්ඩායම් සඳහා වෙනස්කොට නොසැලකීම සහ නිදහස් ප්‍රවිෂ්ඨයන්.
5. ආපසු පැමිණෙන අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් "සතුරන්" ලෙස නොපිලිගැනීම හෝ සතුරන්ට මෙන් නොසැලකීම.

## සිව්වන තේමාව :දේපල ආපසු ලබා ගැනීම හෝ වන්දි ලබා ගැනීම
### මූල ධර්මය : 29 (2)

> තම වාසස්ථාන වෙත ආපසු පැමිණි සහ/හෝ යලි පදිංචි කරණු ලැබූ අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට හැකි පමණින්, අවතැන්වීම හේතුවෙන් ඔවුන් අත්හැර දමා පැමිණි හෝ අයිතිය අහිමිවූ ඔවුන්ගේ දේපල සහ සන්තක දේ, නැවත ලබා ගැනීමට සහාය වීමේ යුතුකම සහ වගකීම නිසි බලධාරීන් වෙත පැවරේ. එබඳු දේපල සහ සන්තක දේ නැවත ලබා ගැනීමට නොහැකිවූ විටදී ඒ වෙනුවෙන් සුදුසු වන්දියක් ලබා ගැනීමට හෝ වන්දියක ස්වරූපයෙන් වෙනත් සාධාරණ දෙයක් එම පුද්ගලයින්හට ලබා දීම හෝ එසේ ලබා ගැනීම සඳහා සහාය වීම නිසි බලධාරීන්ගේ යුතුකම හා වගකීම වන්නේය.

"මාර්ගෝපදේශ මූල ධර්මයන්හි" දේපල පිළිබඳ කරුණ බහුමාන තත්ත්වයකි. එයට හේතුව එය අවතැන්වීමට පෙර පදිංචිව සිටියාවූ දේපලවල ආරක්ෂාව පිළිබඳව පමණක් නොව අවතැන්වී සිටින්නාවූ අවධිය තුලදී අත්කරගනු ලබන්නාවූ දේපල පිළිබඳවද කේන්ද්‍ර වන්නාවූ බැවිනි.

1 ගෞරවාන්විත ලෙස ආපසු පැමිණීම සඳහා පෞද්ගලික දේපල ආපසු ලබා දීම ඉතා වැදගත් වන්නේය.

2 නැවත පැමිණීමේ ක්‍රියාවලියේදී, හැකිතාක් දුරට අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට ඔවුන්ගේ ජීවිකාවෘත්තීන් සඳහා අවශ්‍ය වන්නාවූ දේපල ආදිය ඔවුන්ගේ කලින් පදිංචිව සිටි ප්‍රදේශ කරා ප්‍රවාහනය කිරීමට සහාය විය යුතුය.

3 අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් ආපසු යැවීමේදී ඔවුනට විශේෂයෙන්ම ගොවිතැන සඳහා බිම් ලබාගැනීමේ ඉඩ ප්‍රස්ථාව ලබාදීම එසේ ආපසු යැවීම් හි කෙටිකාලීන සහ මධ්‍ය සහ දිගු කාලීන ද්විත්වයෙහිම තිරසාරත්වය සඳහා ඉතා වැදගත් වන්නේය. නොඑසේනම් ඔවුන් ආධාර මත යැපෙන්නන් බවට පත්වනු ඇත.

4 දේපල පිළිබඳ ගැටළු බොහෝ විට අර්බුද දිගින් දිගටම පැවතීම සඳහා මූලාශ්‍රයන් වන හෙයින් ස්ථානීය අර්බුද නිරාකරණය කිරීමේ විධි ක්‍රමයන් වැදගත් විය හැක.

## පස්වන තේමාව : මානුෂවාදී සංවිධානයන්ගේ ප්‍රවේශය :

**මූල ධර්මය : (30)**

> අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට යලි තම වාසස්ථාන කරා යැමට සහාය වීම හෝ යලි පදිංචි කරවීමට සහ නේවාසික ප්‍රජාව සමඟ ඒකාබද්ධ කිරීම සඳහා ඔවුන් වෙත කඩිනමින් හා බාධාවලින් තොරව ලඟාවිය හැකි ලෙස, අදාල සියළුම බලධාරීන් විසින් ජාත්‍යන්තර මානුෂවාදී සංවිධාන වලට සහ වෙනත් යෝග්‍ය ක්‍රියාකාරකයින් හට ඉඩ සලසා දීම සහ සහාය වීම සිදු කළ යුතුය.

1 සහාය සැලසීමේ දෘෂ්ඨී කෝණයෙන් බලන කළ අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට සහාය ලබා ගැනීමට ලඟාවීමේ ඉඩ ප්‍රස්ථා සහතික කිරීම වැදගත් වන්නේය. (මූල ධර්මය 3, සහාය ලබා ගැනීමේ සහ ඉල්ලා සිටීමේ අයිතිය) එලෙසින්ම ඔවුනට මානුෂවාදී සහාය ලබා ගැනීම සඳහා නිදහස් ප්‍රවේශයක් සහ මාර්ගය සැලසීම සහතික කිරීමද වැදගත්ය. (මූල ධර්මය 25 (3) සහාය සැලසීම ආරක්ෂාකරණු ලබයි).

## වැඩ සටහන් ප්‍රතිචාර සඳහා ප්‍රජාමුල දෘෂ්ඨි කෝණයක්

අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් අක්‍රිය හුදු ආධාර සහ ආරක්ෂාව ලබන්නන් නොව, ඔවුන්ගේ අවශ්‍යතාවයන් හඳුනා ගැනීමට සහ ඒවා ආමන්ත්‍රණය කළ හැකි සහ එසේ කළ යුතු මුඛ්‍ය ක්‍රියාකාරකයින්ය. ඒ අනුව, අවතැන්වීමේ අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීමේදී ඒ සඳහා වන වැඩ සටහන් අභ්‍යන්තරව අවතැන්වූ ප්‍රජාවන්ගේ හැකියාවන් උකහා ගන්නා සහ ඒවා මත ගොඩගැගෙන්නාවූ ලෙසින් සැලසුම් කළ යුතුය. එසේ කිරීමෙහි වැදගත්කම "මාර්ගෝපදේශ මුල ධර්ම" සහ ඒවායින් ආවරණය වන්නාවූ, අභ්‍යන්තර අවතැන්වීම් හා සබැඳුනු අදියරයන් හා අංගයන් පුරා විහිදී යන, සියළු අංශ සහ අංග සහ සබැඳි තේමාවක් ලෙස දැක්වෙනු ඇත.

වැඩ සටහන් නිර්මාණයේදී මෙම මුඛ්‍ය පදාර්ථයන් අන්තර්ගත විය යුතුය.

**මුඛ්‍ය තේමා/සංකල්ප**

- අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් අක්‍රියයන් නොව, ඔවුන්ගේ අවශ්‍යතාවයන් හඳුනා ගැනීමට සහ ඒවා ආමන්ත්‍රණය කිරීම සඳහා වන මුඛ්‍ය ක්‍රියාකාරකයින්ය.
- "ආධාර ලබන්නන්" සම්පත් ලෙස දැක්ම.
- අභ්‍යන්තර අවතැන්වීම් සඳහා ප්‍රතිචාරයන් දැක්වීමේදී, අවතැන්වූවන්ගේ දෘෂ්ඨි කෝණයන් සැලකිල්ලට ගැනීම සහ ඔවුන්ගේ හැකියාවන් උකහා ගත යුතු අතරම එම හැකියාවන් මත ගොඩනැගීමද අවශ්‍යය.
- තේමා
  - පවුල් හා ප්‍රජා සම්බන්ධතා සංරක්ෂණය.
  - ස්වෝපාකාර ක්‍රමෝපායයන්ට සහාය දීම.
  - ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කරගැනීම පිණිස අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් බලගැන්වීම.
  - තීරණ ගැනීමේදී අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් සම්බන්ධ කර ගැනීම.
  - ස්වශක්ති ප්‍රවර්ධනය.

## පළමු තේමාව : පවුල් හා ප්‍රජා සම්බන්ධතා සංරක්ෂණය

### පවුල් සම්බන්ධතා සංරක්ෂණය

**මූල ධර්මය 17**

1 සෑම මනුෂ්‍යයකුටම, ඔහුගේ හෝ ඇයගේ පවුල් ජීවිතයට ගරුත්වය ලැබීමේ අයිතිය තිබේ.

2 අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට ඉහත අයිතිය සහතික කිරීම උදෙසා, එක්ව සිටීමට අපේක්ෂා කරන පවුලේ සමාජිකයින් හට එසේ කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දිය යුතුය.

3 අවතැන් වීම නිසා වෙන්වීමට ලක්වූ පවුල් හැකිතාක් ඉක්මණින් නැවත එකතු කළ යුතුය. විශේෂයෙන්ම දරුවන් සම්බන්ධ වන විටදී එවැනි පවුල්වල අය එක්තැන් කිරීම කඩිනම් කිරීම සඳහා සියලුම යෝග්‍ය පියවර ගත යුතුය. පවුලේ සාමාජිකයින්ගේ විමසීම්වලට සහයෝගීතාවය සලසමින්, පවුල් යලි ඒකාබද්ධ කිරීමේ කාර්යයෙහි නියැලි මානුෂවාදී සංවිධාන වල වැඩ කටයුතු දිරිමත් කිරීමටත්, ඒවාට සහයෝගය ලබා දීමටත් වග කිව යුතු බලධාරීන් කටයුතු කළ යුතුය.

4 සිරකර තැබීම හෝ කඳවුරුවල රඳවා තබාගැනීම හේතුවෙන් තම පෞද්ගලික ස්වාධීනත්වය සීමා කරණු ලැබුවාවූ අභ්‍යන්තරව අවතැන්වූ පවුල්වල සාමාජිකයින් හට එක්ව රැඳී සිටිමේ අයිතිය හිමි විය යුතුය.

පවුල් එක්සත් කිරීම, හුදෙකලා හෝ වෙන්වූ ළමුන් සඳහා සහාය ව්‍යුහයන් උත්පාදනය කිරීම, අවතැන්වූ පුද්ගලයින් හට ඔවුන්ගේ ගමෙහි සාමාජිකයින් හා රැඳී සිටීමට හෝ ඔවුන් හා සම්බන්ධ වීමට මග සැලසීම ආදී ප්‍රයත්නයන් සඳහා ඉහල ප්‍රමුඛත්වයක් හිමි විය යුතුය.

## මූල ධර්මය 16 (1) සහ (2)

1 සියලුම අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට අතුරුදන්වූ තම ඥාතීන්ට අත්වූ ඉරණම සහ ඔවුන් කොහේ සිටීද යන්න ගැන දැන ගැනීමට අයිතිය ඇත.

2 අතුරුදන් වුවන් ලෙස වාර්තා කරනු ලැබූ අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට අත්වූ ඉරණම සහ ඔවුන් කොහේ සිටීද යන්න සැක හැර තහවුරු කර ගැනීම සඳහා අදාල බලධාරින් ප්‍රයත්න දැරිය යුතුය. එසේම, මෙම කාර්යයේ නියුක්තව සිටින අදාල ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගීව ක්‍රියා කළ යුතුය. පරීක්ෂණ වල ප්‍රගතිය ඔවුන්ගේ සමීපතම ඥාතීන්ට දන්වා සිටිය යුතු අතර කිසියම් ප්‍රතිඵල ඇතොත් ඔවුන්ට දැනුම්දිම කල යුතුය.

### ප්‍රජා සම්බන්ධතා සංරක්ෂණය

ප්‍රජා ව්‍යුහයන්, අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්ගේ ආරක්ෂාව පිළිබඳ මූලික මූලාශ්‍රයක් නියෝජනය කරණු ලබයි. දුර්වල වන්නාවූ හෝ සිඳී යන්නාවූ ප්‍රජා සම්බන්ධතා අභ්‍යන්තරව අවතැන්වුවන්ගේ පීඩාවට ලක්වීමේ ඉඩකඩ වැඩි කරයි. ප්‍රජා සම්බන්ධතා පවත්වාගෙන යාම හෝ සංරක්ෂණය, සරණ පතා රැඳී සිටින ප්‍රදේශයන්හි ප්‍රජාව තුල අන්තර්ගත කිරිම සහ ආපසු යැවීම හෝ යලි පදිංචි කරවීම ආදිය, ප්‍රවර්ධනය කරන්නාවූ ක්‍රියාකාරකම්, එම නිසා අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්ගේ සුරක්ෂිතභාවය වැඩි දියුණු කිරීම සඳහා වැදගත් උපක්‍රම වන්නේය.

මෙහිදී සැලකිල්ලට ගතයුතු සාධක වන්නේ, අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගල කණ්ඩායම් අතර ප්‍රජා අනන්‍යතාවය සංරක්ෂණය කර ගැනීම සහ ප්‍රජා කටයුතුවලදී අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්ගේ සහභාගීත්වයත් ය. අභ්‍යන්තරව අවතැන්වූ ජනතාවගේ භාෂාමය උරුමයන්, ආගම හෝ විශ්වාසයන් සහ සංස්කෘතික අනන්‍යතාවය ආදීන්ට ගරු කිරීමද වැදගත්ය.

## මූල ධර්මය 22

කඳවුරු තුළ ජීවත් වුවද, නොවුවද, අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට ඔවුන්ගේ අවතැන් වීමේ ප්‍රතිඵලයක් ලෙස පහත සඳහන් අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතිය පිළිබඳව, වෙනස් කොට සැලකීමට ලක් නොවිය යුතුය.

(අ) සිතීමේ නිදහස, හෘදසාක්ෂිය, ආගම හෝ ඇදහීම, මතවාද සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සඳහා වන අයිතිය.

(ආ) නිදහස් ලෙස, රැකියා අවශ්‍යතාවන් පිළිබඳව සොයා බැලීමට සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීම පිළිබද අයිතිය.

(ඇ) ප්‍රජා කටයුතුවලට නිදහස් ලෙස සම්බන්ධ වීමට සහ සමාන ලෙස සහභාගී වීමට ඇති අයිතිය.

(ඈ) ඡන්දය පාවිච්චි කිරීමට සහ පාර්ලිමේන්තු හා රාජ්‍ය කටයුතුවලට සහභාගී වීමේ අයිතිය. මෙම අයිතිය පාවිච්චි කිරීම සඳහා අවශ්‍ය වන පහසුකම් කරා ප්‍රවිෂ්ඨය සඳහා වන අයිතිය ද මෙයට ඇතුලත් වේ.

(ඉ) තමන්හට තේරුම් ගත හැකි භාෂාවකින් සංනිවේදනය කිරීමේ අයිතිය.

## මූල ධර්මය 23(2)

(අ) සෑම මනුෂ්‍යයෙකුටම අධ්‍යාපනය ලැබීමේ හිමිකම ඇත්තේය.

(ආ) මෙම හිමිකමෙහි ඵලය අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් සඳහා සැලකීමේදී, අදාල බලධාරීන් විසින් එවැනි පුද්ගලයින්, විශේෂයෙන්ම ළමයින්, නිදහස් ලෙස හා ප්‍රාථමික මට්ටමේදී අනිවාර්ය ලෙසින් අධ්‍යාපනය ලබන බවට වග බලා ගත යුතුය. එම අධ්‍යාපනය ඔවුන්ගේ සංස්කෘතික අනන්‍යතාවය, භාෂාව සහ ආගම ආදීන්ට ගරුත්වය ලබා දිය යුතුය.

## දෙවන තේමාව : ස්වෝපාකාර ක්‍රමෝපායයන් සඳහා සහාය වීම

අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට ඔවුන්ගේ පෙර තිබූ පවුල් හා ප්‍රජා සම්බන්ධතා පවත්වා ගැනීමට හෝ යලි ස්ථාපිත කර ගැනීම සඳහා ඉඩ සලසා දීම වැදගත්ය. සාමූහිකව ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඇමතීමේ ප්‍රයත්න දැරීම සඳහා අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් ඔවුන් විසින්ම සංවිධානය වීමට ගන්නා ප්‍රයත්නයන් මෙම නව සමාජීය හැඟීම පැහැදිලි ලෙස හුවා දක්වයි. අවතැන්වූ ජනතාව අතර සහ ඔවුන් හා ආපසු යවනු ලබන හෝ යලි පදිංචි කරණු ලබන ප්‍රදේශවල නේවාසික ප්‍රජාව අතර අර්බුද නිරාකරණය කිරීම සහ සමගි සංධානයන් සඳහා යොදා ගනු ලබන මුල් පිරීම්, අභ්‍යන්තරව අවතැන්වූවන්ගේ සුරක්ෂිතභාවයට දායක විය හැකි අතර අනෙකුත් ප්‍රජාව සමඟ ඒකාබද්ධ වීමටද කටයුතු සලසා දෙනු ඇත.

## තෙවන තේමාව : අවතැන්වූවන් ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමෙහිලා බලගැන්වීම

**මූල ධර්මය 3(2)**

> අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට මෙම (ජාතික) බලධාරීන්ගෙන්, ආරක්ෂාව සහ මානුෂවාදී සහායන් ඉල්ලා සිටීමට සහ ලබා ගැනීමට අයිතිය තිබේ. එබඳු ඉල්ලීමක් කිරීම හේතුවෙන් ඔවුන් වධ බන්ධන වලට හෝ දණ්ඩනයන්ට ලක් නොකළ යුතුය.

**මූල ධර්මය 22(1) (ඇ)**

> 1. කඳවුරු තුල ජීවත්වුවද, නොවුවද අභ්‍යණ්තරව අවතැන්වූ පුද්ගලයින් හට, ඔවුන් අවතැන්වීමේ ප්‍රතිඵලයක් ලෙස පහත සඳහන් අයිතිවාසිකම් භුක්තිවිදීමට එරෙහිව වෙනස් කොට සැලකීමට ලක් නොවිය යුතුය.
>
> (ඇ) ප්‍රජා කටයුතු වලට නිදහසේ හවුල්වීම සහ සමාන ලෙස සහභාගි වීම සඳහා වන අයිතිය.

අභ්‍යන්තරව අවතැන්වූවන් හට, සාමූහිකව ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කර ගැනීම පිළිබඳව හඬක් නැගීම සඳහා විධිමත් ලෙස කණ්ඩායම් වශයෙන් සංවිධානය විය හැකිය. බලධාරීන් විසින් මෙම අභ්‍යන්තරව අවතැන්වූවන්ගේ සංවිධානයන් හට මෙලෙස හඬක් නැගීමට යෝග්‍ය පරිසරයන් තුළ ක්‍රියාත්මක වීම සඳහා ඉඩ සැලසීමට වග බලා ගත යුතු බව අපේක්ෂා කළ යුතුය.

## සිව්වන තේමාව : තීරණ ගැනීමේදී අවතැන්වූවන් සම්බන්ධ කර ගැනීම

අභ්‍යන්තරව අවතැන්වූවන්, ඔවුන්ගේ ජීවිත වලට බලපෑම් ඇති කරණු ලබන තීරණ ගැනීමේදී සම්බන්ධ කර ගත යුතුය. ඔවුන්ගේ අවශ්‍යතාවයනට ප්‍රතිචාර වශයෙන් වූ වැඩ සටහන් නිර්මාණයේදී ඔවුන්ගේ අදහස් සැලකිල්ලට ගැනීම, එම වැඩ සටහන් වල යෝග්‍යතාවය සහ සඵලතාවය සහතික කර ගැනීමට උපකාරී විය හැකිය.

### මූල ධර්මය 7(3) (ඇ) සහ (ඈ)

> අවතැන් කිරීම්, සන්නද්ධ අරගල සහ ව්‍යසන නිසා ඇතිවන හදිසි අවස්ථාවලදී හැර වෙනත් අවස්ථාවන්හිදී සිදු වන්නේ නම් පහත දැක්වෙන අභිමතාර්ථයන් ඉෂ්ඨ කළ යුතුය.
>
> (ඇ) අවතැන් කිරීමට නියමිත පුද්ගලයින්ගේ ස්වාධීන හා තත්ත්වය අවබෝධ කර ගනිමින් කෙරෙන එකඟතාවය ලබා ගැනීමට උත්සාහ කළ යුතුය.
>
> (ඈ) අදාල බලධාරීන්, අවතැන්වීමට ලක්වූවන්, ඔවුන්ගේ නැවත පදිංචි කිරීම සැලසුම්කරණයේදි සහ කළමනාකරණයේදී සම්බන්ධ කර ගැනීම සඳහා ප්‍රයත්න දැරිය යුතුය.

### මූල ධර්මය 28(2)

> ඔවුන්ගේ ආපසු යැවීම් හෝ යලි පදිංචි කරවීම හෝ යලි ඒකාබද්ධ කිරීම සැලසුම්කරණයේදී හා කළමනාකරණයේදී අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයන්ගේ පූර්ණ සහභාගීත්වය ලබාගැනීම තහවුරු කිරීම සඳහා විශේෂ ප්‍රයත්නයන් දැරිය යුතුය.

මූල ධර්මය 28(2), ඉහතදී සඳහන් කෙරුණු අයුරින්, ඔවුන්ගේ ආපසු යැවීම් හෝ යලි පදිංචි කරවීම සහ යලි ඒකාබද්ධ කිරීම, සැලසුම්කරණයේදී සහ කළමනාකරණයේදී, අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්ගේ පූර්ණ සහභාගීත්වය ඉල්ලා සිටී. අවතැන්වූවන්ගේ අදහස් සලකා බැලීමේදී, සමස්ත ජන සමාජයේ සියලුම කොටස්වල අදහස් ඉල්ලා සිටීම අත්‍යාවශ්‍යය. අභ්‍යන්තරව අවතැන්වූ ජනතාවගෙන් ඉතා ප්‍රබලවූ බහුතරයක් සමන්විත වන්නේ කාන්තාවන්ගෙන් සහ ළමයින්ගෙන් බව

නොසලකා හැරෙමින් බොහෝවිට කාන්තාවන්ගේ අදහස් විමසීමෙහි ඇති වැදගත්කම නොසලකා හැරෙමින් ඔවුන්ගේ හැකියාවන් ප්‍රතික්ෂේප කෙරේ.

**මුල ධර්ම 7(3) (ඈ) සහ (ඈ)**

අවතැන් කිරීම් සන්නද්ධ අරගල සහ ව්‍යසන නිසා ඇතිවන හදිසි අවස්ථාවලදී හැර වෙනත් අවස්ථා වලදී සිදුවන්නේ නම් පහත දැක්වෙන අභිමතාර්ථයන් ඉෂ්ඨ කළ යුතුය.

(ඈ) අදාල බලධාරීන්, අවතැන්වීමට ලක්වුවන් විශේෂයෙන්ම කාන්තාවන්, ඔවුන්ගේ නැවත පදිංචි කිරීම සැලසුම්කරණයේදී සහ කළමනාකරණයේදී සම්බන්ධ කර ගැනීම සඳහා සියලුම ප්‍රයත්න දැරිය යුතුය.

**මුල ධර්මය 18(3)**

මූලික අවශ්‍යතා සැපයීම් සැලසුම්කරණයේදී සහ බෙදාහැරීමේදී කාන්තාවන්ගේ පූර්ණ සහභාගීත්වය සහතික කිරීමට විශේෂ ප්‍රයත්න දැරිය යුතුය.

## පස්වන තේමාව : ස්වශක්තිය ප්‍රවර්ධනය කිරීම

අවතැන්වුවන්ගේ සම්පත් සහ හැකියාවන් උකහා ගනිමින් ඒ මත ගොඩ නැගෙන අයුරින්, විශේෂයෙන් දිගු කාලීන දෘෂ්ඨියකට අනුව, වැඩ සටහන් සැලසුම් කිරීම අත්‍යාවශ්‍යයය. අවතැන්වුවන්ගේ ස්ව ශක්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉඩ ප්‍රස්ථා නොලැබෙන තාක් කල් ඔවුන් හදිසි අවස්ථාව අවසන් වී බොහෝ කල් ගතවුවද, සහණාධාර මත යැපෙන්නන් ලෙසම පවතිනු ඇත.

### මූල ධර්මය 22 (ආ)

> කඳවුරු තුල ජීවත්වුවද නොවුවද අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට, ඔවුන් අවතැන්වීමේ ප්‍රතිඵලයක් ලෙස, පහත සඳහන් අයිතිවාසිකම් භුක්තිවිඳීමට එරෙහිව වෙනස් කොට සැලකීමට ලක් නොවිය යුතුය.
>
> (ආ) නිදහසේ රැකියා අවස්ථා සොයා යාමට ඇති අයිතිය සහ ආර්ථික ක්‍රියාකාරකම් වලට සහභාගි වීමේ අයිතිය.

කල් ගත වන්නාවූ අවතැන්වීම් තත්ත්වයන් තුළදී කුසලතාවයන්ගේ පිරිහීම ප්‍රබල අවදානමක් වන්නේය. ආදායම් ඉපැයීමේ ඉඩප්‍රස්ථා ඇති ක්‍රියාකාරකම් අභ්‍යන්තරව අවතැන්වුවන් ඔවුන්ගේ මුල් ප්‍රදේශ වලදී නියැලී සිටි කාර්යයන්ට වෙනස්වන අවස්ථාවන්හිදී නව කුසලතාවයන් වර්ධනය කර ගැනීමට සිදු විය හැක.

### මූල ධර්මය 23(4)

> අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට අධ්‍යාපනික හා පුහුණුවීම් පහසුකම් ලබා දිය යුතුය. විශේෂයෙන්ම යෞවනයින්ට සහ කාන්තාවන්ට ඔවුන් කඳවුරු තුල ජීවත්වුවද, නොවුවද, සුදුසු තත්ත්වයන් උදාවූ වහාම එම පහසුකම් ලබා දිය යුතුය.

ඉහත මූල ධර්මය, කාන්තාවන්ට අධ්‍යාපන සහ පුහුණු පහසුකම් කරා ලගා වීමට ඇති අයිතිය පිළිබඳ විශේෂ අවධාරණයක් දක්වයි. කාන්තාවන්ට පුහුණුව ලබා ගැනීමට ඉඩ සැලසී ඇති කුසලතා පිළිබඳවද අවධානය යොමු කිරීම වැදගත්ය.

අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් සඳහා වන ආධාර සහ සංවර්ධන වැඩසටහන් හැකි තරම් දුරට අවතැන්වුවන්ම යොදා ගෙන සිදු කළ හැකිය. එය එසේ කළ යුතුය.

## අවතැන්වීම් කෙළවර වන්නේ කවරදාද ?

මෙය බොහෝ සෙයින් විවාදයට ලක්වු කරුණකි. කල් පවත්නා විසඳුමකට එළැඹීමෙන් අවතැන්වීම් කෙළවර වනු ඇත. එනමුදු, අවතැන්වීම් කවරදා කෙළවර වේද යන්න නිශ්චය කර ගැනීම සංකීර්ණය. හඳුනා ගනු ලැබූ නිර්ණායක තුනක් තුළින් එයට අවතීර්ණ විය හැකිය.

### 1. හේතු කාරක - පාදක නිර්ණායක

| අභ්‍යන්තර අවතැන්වීම් වල හේතුකාරක තව දුරටත් නොපවතී. |
|---|

ශ්‍රී ලංකාවෙහි වලංගුව පවත්නා යුද විරාමයක් පැවතියද, සාම ක්‍රියාවලියෙහි සමාප්තියක් නොමැති අතර එය ඇත්තෙන්ම යුද්ධය සහ අවසන් සාමය අතර සංක්‍රාන්ති තත්ත්වයක පවතී. එමනිසා අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් සඳහා කල් පවත්නා විසඳුම් අවශ්‍යයෙන්ම අනුගමනය නොවනු ඇත. තත්ත්වයන්ගේ වෙනස්වීමක් සිදු වුවද සමහර ආයතන ස්ථාවර තත්ත්වයක් ඇතිවන තුරු ආපසු යැවීම් අනුමත කරණු නොලබයි. ආපසු පැමිණෙන්නාවූ, අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් එසේ පැමිණෙන්නේ ඔවුන්ගේම තනි කැමැත්තෙන්, ආධාර පද්ධතීන්ගේ සහ යන්ත්‍රනයන්ගේ සමහර සහායන් ලබමිනි. මේ අනුව ආපසු පැමිණීම් ඇත්තෙන්ම "රාජකාරීමය ලෙසින්" සිදු නොවේ. ආපසු යැවීම් පූර්ණ වශයෙන් සාධාරණීකරණය වීමට නම් කෙනෙකුට අවතැන්වීමට පාදකවූ මුල් හේතු කාරක සඳහා අවසන් විසඳුමක් සෙවීමට සිදුවේ.

### 2. විසඳුම් - පාදක නිර්ණායක

| ආපසු යැවීම හොඳම විකල්පය ලෙස පෙනේ. |
|---|

කෙසේවුවද, පහත සඳහන් දෑ සිත්හි තබාගත යුතුය.

1. ආපසු යනු ලබන ස්ථානවල සුරක්ෂිතභාවයක් නොමැති වීම
2. යලි ඒකාබද්ධ කිරීම සඳහා සහාය ප්‍රමාණවත් නොවීම
3. දේපල සඳහා වන්දි නොමැතිවීම
4. සේවාවන් සඳහා ප්‍රවේශය
5. ස්වයං පෝෂිත බව
6. ආපසු යැවීම් ස්වේච්ඡාවෙන් විය යුතුය

මීට අමතරව, අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් ආපසු පැමිණියද කෙනෙකු එසේ ආපසු යැවීම හෝ යලි පදිංචි කරවීම පිළිබඳ හුදු ක්‍රියාව අවතැන්වීම් සඳහා අවසානයක් ලෙස සැලකිල්ලට ගත හැකි පදනමක් ලෙසින් ලිහිල්ව නොතැකීමට පරීක්ෂාකාරී විය යුතුය. අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට ඔවුන් ඒකාබද්ධව සිටින ප්‍රදේශයේම රැඳී සිටීමට හෝ දේශයෙහි වෙනත් කොටසකට යාමේ අයිතිය ඇති බවද සිහි තබා ගත යුතු තවත් කරුණකි.

### 3. අවශ්‍යතාවයන් - පාදක නිර්ණායක

> අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට විශේෂිතවූ අවශ්‍යතාවයන් සහ පහසුවෙන් පීඩාවට ලක්වීමේ ඉඩකඩ තව දුරටත් නොපවතී.

මෙම නිර්ණායකය අදාල වන්නේ, සමහර අවස්ථාවන්හීදී ජාත්‍යන්තර ප්‍රජාවගේ සහයෝගය සහිතව ශ්‍රී ලංකා ජන රජය වෙතින් ආරක්ෂාව සහ ආධාර ලබා ගැනීමට හැකියාව ඇති අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් සඳහාය.

## ඒකාබද්ධ පිවිසුම

ඉහත සඳහන් නිර්ණායක තුන තනි තනිව එකිනෙකට විශේෂිත වුවන් නොව පොදු මුලධාතුන් අන්තර්ගත වුවන්ය. එම නිසාම, ආපසු යැවීම, යලි පදිංචි කරවීම හෝ ප්‍රාදේශීයව යලි එකාබද්ධ කිරිම සඳහා අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට විකල්ප සැලසෙන බවට වග බලා ගනිමින් ඒකාබද්ධ පිවිසුමක් යොදා ගැනීම නිර්දේශ කරයි. අවතැන්වීම් තුළින් ජනිත වුවාවූ විශේෂිත වූ අවශ්‍යතාවයන් සහ පහසුවෙන් පීඩාවට ලක්වීමට ඇති ඉඩ ප්‍රස්ථා, විසඳුම් බලවත් සහ කල්පවත්නා අයුරින් ආමන්ත්‍රණය කළ යුතුය. මේ නයින් බලන කල හේතු කාරක - පාදක නිර්ණායක බොහෝ විට අවතැන්වීම් වලට අවසානයක් නිශ්චය කරගැනීම සඳහා ප්‍රධාන සාධකයක් වන බව හඳුනා ගත යුතුය.

**සර්ව සුභවාදී ඉලක්කයක් වන්නේ අවතැන්වීම් 2006 වසර වන විටදී අවසන් කිරිමය.**

# දෙවන කොටස

## ශ්‍රී ලංකාවට විශේෂිතවූ කරුණු සහ ක්‍රියාත්මකවීම් සඳහා කැඳවුමක්

### වැළැක්වීම

අභ්‍යන්තර අවතැන්වීම් ආමන්ත්‍රණය කිරීමේ වඩාත් ඵලදායී මාර්ගය වන්නේ, ඔවුන්ගේ අභිමතයන්ට එරෙහිව පුද්ගලයින් ඔවුන්ගේ නිවාස අත්හැර යාමට බලපෑම් ඇති කරන්නාවූ තත්ත්වයන් මග හැරවීමයි. අත්තනෝමතික අවතැන් කිරීම් වලින් ආරක්ෂාව මූලික මානව අයිතිවාසිකමකි. සියලුම හේතූන් මත සිදු කෙරෙන අවතැන් කිරීම් වලක්වාලිය යුතු අතර අවතැන්වීම් වැළැක්වීම සඳහා සියලුම ක්‍රම සහ විධි භාවිතා කළ යුතුය. වසර 20 ක් පුරා ශ්‍රී ලංකාවෙහි පැවති යුද්ධමය තත්ත්වය තුළ කිසිදු ඒජන්සියක් හෝ මඩුල්ලක් අවතැන්වීම් වලක්වාලීමට අපොහොසත් වීම දුක්ඛදායකය. මෙහිදී ඉගෙනීමට පාඩම් ඇත. මේ වන විටදීත් කඩිනමින් අනතුරු හැඟවීමේ යන්ත්‍රනයන් ස්ථානගතව තිබිය යුතුය. පවතින තත්ත්වයෙහි සහ වර්ධනය වන්නාවූ තත්ත්වයන් පිළිබඳ තොරතුරු රැස්කිරීම වැදගත් ලෙස පවතී. ශ්‍රී ලංකාව තුළ විවිධ ජනතාවගේ ජනගහන බෙදීයාම පිළිබඳව එය සම්බන්ධ නිසා එයට දේශපාලනමය පසුබිමක්ද ඇඳී ඇත. යෝජිත අන්තර්පාලන තන්ත්‍රය සහ සැකසුම් ඒවාටම ආවේනික සංකීර්ණත්වයන් සමඟ පැමිණෙනු ඇත. ඒවා යලි පදිංචි වන්නන්ගේ ආරක්ෂාවට සහ සුරක්ෂිත භාවයට නිසැක වශයෙන්ම බල පානු ඇත. පරිපාලන ඒකකය සහ ඒ කැටුව එන්නාවූ බලයන් පැහැදිලි වීමෙන් පසුව අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් සහ සරණාගතයින්ගේ ආරක්ෂාව සඳහා වන මධ්‍යම සහ කළාපීය ප්‍රවේශයන් සම්බන්ධීකරණය සහ ඒකාබද්ධ කිරීමේ විශේෂ අභියෝගය මතු වනු ඇත.

අවතැන්කිරීම නොවැළැක්විය හැකි වන්නේ නම් එය තාවකාලික විය යුතුය. එය අවශ්‍ය වන කාලසීමාවට වඩා දීර්ඝ නොවිය යුතුය. මෙයින් අදහස් වන්නේ අවතැන් කිරීම් සඳහා විසඳුම් ගවේශණය සහ ක්‍රියාත්මක කිරීම හැකි ඉක්මණින් සිදු කළ යුතු බවය. අවතැන් කිරීම් පිළිබඳ උග්‍ර අවස්ථාවන් නියත වශයෙන්ම මතු වන්නේ ආරක්ෂාව සැපයීම අසාර්ථක වීම තුළිනි.

අර්බුද නිරාකරණය සඳහා විශේෂයෙන්ම අසමානතාවය සහ දුලබ සම්පත් සඳහා වන තරඟකාරීත්වය වැනි හේතු කාරකයන් කෙරෙහි අවධානය අවශ්‍ය කෙරේ.

## ක්‍රියාත්මක වීම් සඳහා කැඳවුම

1 ප්‍රජාවන්, බලධාරීන් සහ සංවිධානවලට අවතැන්වීම් පිළිබඳ අවදානම පිළිබඳව දැනුම් දිය හැකි වේලාසනින් අනතුරු ඇඟවීමේ පද්ධති ස්ථාපිත කිරීම.

2 අවතැන්වීම් සඳහා විකල්ප වශයෙන් සිදු කිරීමට අවකාශ ඇති ක්‍රියාමාර්ග හඳුනා ගැනීම පිණිස ප්‍රදේශීය ප්‍රජාව සමඟ සාකච්ඡා පැවැත්වීම. ජාතික බලධාරීන්ට වඩා ඔවුන් විකල්ප පිළිබඳව වඩා අවබෝධයක් සහිත වන්නේය. තීරණ ගැනීමේදී ඔවුන් ඊට දායක වූ බව පුද්ගලයින්ට දැනිය යුතුය.

3 ප්‍රජා නායකයින් සහ වෙනත් බලධාරීන් සමඟ සාකච්ඡාවන් තුළින් සහ විශ්ලේෂණ හා අධ්‍යයනයන් තුළින් අවතැන්වීම් සඳහා වන විකල්ප පිළිබඳව සොයා බලන්න.

4 අවදානම සහිත පුද්ගලයින් අතරෙහි සිටින විශේෂිත අවශ්‍යතාවයන් සහිත කණ්ඩායම් හඳුනා ගන්න.

5 ප්‍රජාවන් අවතැන්වීමේ අවදානමට ලක්ව සිටී නම් ඔවුන් වෙනුවෙන් බලධාරීන්, ආධාර ආයතන සහ ජාත්‍යන්තර සංවිධාන වෙත කරුණු දක්වන්න.

6 අවතැන්වීම් වලක්වාලිය හැකියැයි සිතෙන ජාතික සහ ප්‍රාදේශීය බලධාරීන් සහ අවතැන්වූ ප්‍රජාවන් අතර සංනිවේදන මාර්ග විවෘත කරන්න.

7 අවතැන් කිරීම් පිළිබඳව අනතුරු හැඟවීම් ලැබ ඇති ප්‍රජාවන් තුළ ගැවසෙමින් ඔවුන්ගේ අවතැන්වීම් සඳහා ඇති අවදානම අඩු කරන්න.

8 අවතැන්වීම් වලක්වා ලීමේ එකම ස්ථාවර සහ කල් පවත්නා පදනම වන්නේ යහපත් රාජ්‍ය පාලනය බව ඒත්තු ගන්න. රටක ජනතාවගේ යුක්තිය සහ යහ පැවැත්ම සඳහා වන අවශ්‍යතාවයන් කෙරෙහි ප්‍රතිචාර දක්වන්නාවූ යහපත් පාලන තන්ත්‍රයක් අවතැන් කිරීම් උග්‍ර අවස්ථාවන්ට එරෙහිව ආරක්ෂාව සැලසීමේ මගක් ඉදිරිපත් කරණු ලබයි.

9 අත්තනෝමතික ලෙස අවතැන් කිරීම් වලට ලක් නොවීම පිළිබඳ අයිතීන් හුවා දක්වමින් එතුලින් අවතැන්වීම් වලක්වාලිය හැකි නෛතික පදනම ශක්තිමත් කරන්න. මෙම නියමය ජාත්‍යන්තර නීතියෙහි මේ වන විටදීත් ගම්‍යවූ කරුණු නොසැඟවා එළි දක්වනු ලබයි. එයට අවතැන්වීම් වලක්වාලීම සඳහා වන ක්‍රියාත්මක වීම් සඳහා ආරක්ෂාව සහ ඒ සඳහා වන පදනම සැපයිය හැකිය.

10 සුළු ජන කොටස්, ගොවීන් සහ විශේෂිතවූ පරාධීන සහ ඔවුන්ගේ ඉඩ කඩම් ආදියට බැදී සිටින්නාවූ වෙනත් කණ්ඩායම් අවතැන්වීමෙන් වලක්වාලීමට වග බලා ගන්න.

11 නැවත නැවතත් අවතැන්වීම් වලක්වාලීම සඳහා මැදිහත්වීම් සහ ප්‍රතිසන්ධානය කිරීම් ආරම්භ කරන්න.

# ආරක්ෂාව

ආරක්ෂාව යනු මූලික මානව අයිතීන් සුරක්ෂිත කර ගැනීමය. මෙයට සිවිල්, දේශපාලනික, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික හිමිකම් ඇතුලත් වන්නේය. ආරක්ෂාව පිළිබඳ ප්‍රාථමික වගකීම රැදී ඇත්තේ රාජ්‍යයන්ට සහ ඒවායේ රජයන්ටය. "අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ මූල ධර්ම" රාජ්‍යයන්තර ගිවිසුමක් මෙන් එකිනෙකට බැඳ තබන්නාවූ මෙවලමක් නොවුවද, ඒවා පවතින මානුෂවාදී සහ මානව අයිතීන් පිළිබඳ නීති මත පදනම්ව ඇති, අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්ගේ ආරක්ෂාව පිළිබඳව බැඳීම් සහිත මූල්ම වගකිවයුතු ප්‍රකාශ වලින් සමන්විත වන්නේය. මූලධර්මයන් රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් සඳහාද උපයෝගී වන බව මෙහිදී සඳහන් කළ යුතුය.

පෞද්ගලික සුරක්ෂිතභාවය, අභිමානය, ගරුත්වය සහ ආත්ම ගරුත්වය සහිතව ආපසු පැමිණීම ආදී, ආපසු යැවීමේදී සහ යලි පදිංචි කරවීමේදී සැලකිල්ලට ගතයුතු කරුණු ගණනාවක් ඇත. මෙම කරුණු පිළිබඳව එතරම් අවධාරණයක් ලබාදී නොමැත. සුරක්ෂිතභාවය සමඟින්ම ගරුත්වය සහ අභිමානය ඈදී එයි. ඔවුන්ද රටෙහි වැසියන් සේ පිළිගනු ලැබීමටද, අනෙකුත් රටවැසියන් භුක්ති විඳින්නාවූ සියලුම හිමිකම් සහ වරප්‍රසාද භුක්ති විඳීමේ අයිතියද ආපසු එන්නන් හට අවශ්‍ය කෙරේ.

බොහෝ ආපසු එන්නන් එසේ කරුණු ලබන්නේ ස්වේච්ඡාවෙනි. කෙසේවුවද, ඔවුන් හට තොරතුරු දත් විකල්ප තිබුණාද යන්න නිශ්චිත නොමැත. ආපසු පැමිණීම් පිළිබඳව සිදු කෙරෙන්නාවූ සැලසුම්කරණයේදී සහ කළමනාකරණයේදී ඔවුන් විචාරිය යුතු අතර ආපසු පැමිණෙන ප්‍රදේශවල පවත්නා තත්ත්වයන් පිළිබඳවද තොරතුරු ඔවුනට දැන්විය යුතුය.

පුද්ගල නාශක බිම් බෝම්බ සහ UXO අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්හට විශේෂයෙන්ම අවදානම් සහිත වන්නේය. මේවා විනාශ කිරීම සඳහා ප්‍රයත්නයන් දරමින් පවතී. සමීක්ෂණයන් පවත්වමින් බිම් බෝම්බ සහිත ප්‍රදේශ මායිම්ගත කරුණු ලබමින් පවතී. කෙසේ වුවද, යලිත් වරක් එලෙස ප්‍රදේශ සලකුණු කිරීම අසාර්ථක වූ අවස්ථා ගැනද අසන්නට ඇත. විශේෂයෙන්ම A9 මාර්ගයෙන් ඉවත අභ්‍යන්තර ප්‍රදේශයන්හි එසේ යොදා ඇති සලකුණු අප්‍රමාණවත් බව වාර්තාවී ඇත. යලි පදිංචි කරවීමට පෙර බිම් බෝම්බ ඉවත් කිරීම පිළිබඳව වන සහතික කිරීම්ද මතභේද වලට තුඩුදී ඇති ගැටළුවක් ලෙස මතුව ඇත. ගැටළුවෙහි විශාලත්වය අති මහත් සේම එහි ප්‍රති විපාක ඊටත් වඩා වැඩි වුවද සීමිත කාල සීමාවක් සඳහා අරමුදල්

ඇති බවක් පෙනී යයි. පාසල්, වගාභූමි ආදීන්ට ප්‍රවේශයන් ලබා ගැනීම දෛනික ජීවිත වලට බලපෑම් ඇති කරයි. මෙම බිම් බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා රජය සහ ජාත්‍යන්තර සංවිධාන බිම් බෝම්බ ඉවත් කරන්නන්ගේ සංඛ්‍යාව වැඩි කිරීමට සහ ඒ සඳහා යාන්ත්‍රික ක්‍රම උපයෝගීත්වයෙහි වැඩි දියුණු කිරීමක් සඳහා බලාපොරොත්තු වේ. ඔවුන් සඳහා අවශ්‍ය වන්නාවූ අමතර අරමුදල් සොයමින් සිටී.

අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් අතුරින් වැඩි ප්‍රතිශතයක් වන්නාවූ කාන්තාවන් සහ ළමයින්ගේ අවශ්‍යතාවයන් ආරක්‍ෂා කිරීම සඳහා විශේෂ අවධානයක් අවශ්‍ය කෙරේ. එය වයස්ගත පුද්ගලයින්ගේ සහ කායික දුබලතාවයන් සහිත අයගේ අවශ්‍යතාවයන් ආරක්‍ෂා කිරීම සඳහාද එසේමය.

වෙනස්කොට නොසැලකීම සඳහා වන සමස්ත කැපවීමෙහි කොටසක් ලෙසින් විවිධ ජාති, ආගම් සහ භාෂා කතා කරණු ලබන පුද්ගල කණ්ඩායම්වල සාමාජිකයින්ගේ හිමිකම් ආරක්‍ෂාකිරීම සඳහාද ආපසු යනු ලබන අවස්ථාවන්හිදී විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

## ක්‍රියාත්මකවීම් සඳහා කැඳවුම

1 අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව දැනුම් දෙන්න. එවැනි තොරතුරු ව්‍යාපෘති ක්‍රමවේද ගණනාවක් තුළින් සිදුකළ හැකිය.

2 ආරක්‍ෂාව පිළිබඳ මූල ධර්ම ගැන ජාතික සහ සාමය සුරැකීමෙහි නියුතු බලකායන් සහිත හමුදා පිරිස්වලට පුහුණුවක් ලබා දෙන්න.

3 මානව හිමිකම් උල්ලංඝණය කිරීම් වාර්තා කිරීමේ සහ ලේඛනගත කිරීමේ අධීක්‍ෂණ ක්‍රමයක් ස්ථාපිත කරන්න.

4 සියලුම මට්ටම් වලදී බිම් බෝම්බ පිළිබඳව වැඩි වශයෙන් දැනුවත් කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න.

5 බිම් බෝම්බ සහ UFO ඉවත්කිරීම සඳහා අරමුදල් සෙවීමට සහ වැඩි කරගැන්ම සඳහා අවශ්‍ය ප්‍රයත්නයන් දරන්න.

6 රජය සමග මැදිහත් වෙමින් අනාගතයේදී බිම් බෝම්බ ඉවත් කිරීම සඳහා වන අරමුදල් හා සම්බන්ධ, ඔටාවා රාජ්‍යන්තර ගිවිසුමට අත්සන් කිරීමට ඔවුන් පොළඹවන්න.

7 බිම් බෝම්බ ස්ථානගත කිරීම් සම්බන්ධව රජය හා අවශේෂ ගිවිසුම්කට එළඹීම සඳහා LTTE සංවිධානයට පාර්ශව කරුවකු වන ලෙස උනන්දු කරවන්න. මෙය අවසන් සාම ගිවිසුම සඳහා උපයෝගී කර ගත හැක.

8 අවශ්‍ය වන්නේ නම් ජාත්‍යන්තර සංවිධානවල සම්බන්ධයද සහිතව, ආපසු යවනු ලබන හෝ යලි පදිංචි කරවනු ලබන ප්‍රදේශවල මානව හිමිකම් පිළිබඳ තත්ත්වයන් අධීක්ෂණය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන්න.

9 අවදානමට ලක්ව සිටින්නාවු සුළු ජාතික කණ්ඩායම්වලට සලකනු ලබන අයුරු අධීක්ෂණය කරමින්, ආරක්ෂාව පිළිබඳ ක්‍රියාදාමයන් සඳහා ජාතික බලධාරීන් සමඟ මැදිහත්වන්න.

10 සහාය සැලසීම් සහ සංවර්ධනය, ආරක්ෂාව සමඟ ඒකාබද්ධ කිරීම සඳහා වැඩසටහන් නිර්මාණය කරන්න.

11 වඩා හොඳින් ආරක්ෂාව සැලසීම පිළිබඳව වන කටයුතු සඳහා අදාල පුද්ගලයින් පුහුණු කරන්න.

12 ලිංගිකත්වය - විශේෂිතවු ප්‍රචණ්ඩත්වය පිළිබඳ සලක බැලීම්, පුහුණු කිරීම් සහ අධීක්ෂණයන් ක්‍රියාකාරකම් තුළ ඒකාබද්ධ කරන්න.

## ඉඩම්

මෙය සෑම උපදේශනයකදීම මතුවනු ලැබීය. ඉඩම්වල හිමිකාරත්වය, ඉඩම්වල භුක්තිය, අධි ආරක්ෂක කළාප, සහ වන්දි ලබාදීම් ආදිය ප්‍රධාන ගැටළු වේ. අවතැන්වූ බොහෝ පිරිස් ඔවුන්ගේ මුල් වාසස්ථාන කරා ආපසු යෑමට කැමැත්ත ප්‍රකාශ කර සිටියද, බොහෝ අවස්ථාවල ඉඩම් පිළිබඳ ගැටළු ඔවුන්ගේ ආපසු යෑම් වැලැක්වීමට හේතු විය. උදාහරණයක් ලෙස, යාපන අර්ධද්වීපය තුළ ඇති අධි ආරක්ෂිත කළාප නිසා සමහර ප්‍රදේශවලට ආපසු යෑම වලක්වනු ලබයි. මෙම කලාපයන්හි සමහර මුල් පදිංචිකරුවන් යාපනයෙහි වෙනත් ප්‍රදේශවලට ගොස් වෙනත් අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්ගේ නිවාස තුල පදිංචි වූහ. එම නිවාසවල මුල් හිමිකරුවන්ටද ආපසු යෑමට නොහැකිවීම නිසා මෙය අපහසුතාවයන් තවදුරටත් වැඩි වීමට තුඩු දී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් නීතිය ගැටළුවට ලක් කරමින් අප්‍රසන්න සිදුවීම් සහ හිංසාකාරී සැලකීම් සිදුවී ඇත්තේය. නිවාස සම්පූර්ණයෙන්ම විනාශවූ විටදී හෝ රජය විසින් ඉඩම් අත් පත් කර ගනු ලැබූ විටදී ඒ පිළිබඳව වන්දි ලබාදීමද තවත් ගැටළුවකි. අවතැන්වීමට ලක්වූ ඉඩම් නොමැති පිරිස් පිළිබඳව කුමක් කරන්නේද යන්න තවත් ප්‍රශ්ණයකි. ඔවුන් යන්නේ කොතැනකටද ?

### ක්‍රියාත්මකවීම් සඳහා කැඳවුම

1 අවසන් සාම ගිවිසුමේදී, නිවාස සහ දේපල පිළිබඳ ගැටළු සෘජු ලෙස ආමන්ත්‍රණය කරන්න.

2 ඉඩම්, නිවාස හා දේපල පිළිබඳ නීතිමය හා වෙනත් මතභේද විසඳීම සඳහා ගැටළු නිරාකරණය කිරීමේ ආයතනයක් ලෙස සේවය සැපයුම සඳහා ඉඩම්, නිවාස හා දේපල හිමිකම් පිළිබඳ විශේෂ කොමිසමක් ස්ථාපිත කරන්න. විසඳිය නොහැකි මතභේද තීරණ ගනු ලබන අධිකරණ මණ්ඩලයක් වෙත යොමු කළ යුතුය.

3 ව්‍යවස්ථාදායක හා ප්‍රතිපත්ති සංශෝධන කට්ටලයක් විධිමත්ව සකස් කරන්න.

4 අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්ගේ දේපල පිළිබඳ හිමිකම් ආරක්ෂාව සහතික කරන්න. විශේෂයෙන්ම, අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට ඔවුන් ආපසු පැමිණීමෙන් පසු ඔවුන්ගේ ඉඩකඩම් සහ දේපල පිළිබඳ හිමිකම් නිවැරදිව තහවුරු කර ගැනීමට ඉඩ සැලසෙන අයුරින් නීතිය සහ අදාල ලියකියවිලි වටහා ගැනීමට ඉඩ සලසමින් ඔවුනට සහාය සැලසීමෙන් උපකාර කල යුතුය. අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හට ඔවුන්ගේ දේපල

හිමිකම් යලි ඉල්ලා සිටීමේදී අවශ්‍ය වුවහොත් නීතිමය සහාය කරා ලංවීම සඳහා ඉඩ සැලසෙන අයුරු සහතික කෙරෙන වැඩ සටහන්ද නිර්මාණය කළ යුතුය.

## ලිපි ලේඛන

පලා යාමේදී වැදගත් ලිපි ලේඛන ආදිය අස්ථානගත වීම හෝ හැර දමා යාමට සිදුවීම අසාමාන්‍ය සිදුවීමක් නොවේ. පෞද්ගලික හැඳුනුම් පත්, උපත්, විවාහ සහ මරණ සහතික පත්‍ර, ඉඩම් හිමිකම් ඔප්පු ආදීන් මෙසේ නැතිවීමට ලක් වන්නාවූ සමහර ලේඛන වේ. මෙවැනි ලිපි ලේඛන යලි ලබා ගැනීම කෙසේ කඩිනම් කර ගත හැක්කේද යන්න පැහැදිලි ලෙස දැන්වීම සහ ඒවා යලි ලබා දීම කාගේ වගකීමක් වන්නේද යන්න ගැන සොයා බැලිය යුතුය. ග්‍රාමීය මට්ටමේදී ග්‍රාම නිලධාරී තැන මේ සඳහා වග කිව යුතු බව පෙනේ. කෙසේ වුවද, ඔහුගේ/ඇයගේ භූමිකාව දැන් බොහෝවිට, ග්‍රාම ප්‍රතිසංස්කරණ කමිටු ස්ථාපිත කිරීම තුලින් යම්තාක් දුරකින් හානිකර ලෙස බැහැර කෙරේ.

තමිල්නාඩුවේ සිට ආපසු මෙරටට පැමිණෙන්නන්හට ඊටත් වඩා දුෂ්කරතාවයනට මුහුණ පෑමට සිදුව ඇත්තේ ඔවුන්ට ඉන්දියාවේදී උත්පත්තිය ලද ඔවුන්ගේ ළමයින්ගේ උපත් ලියාපදිංචි කිරීම සඳහා ලිපිලේඛන ගණනාවක් ඉදිරිපත් කිරීමට සිදුවන හෙයිනි. ළමයින්ට පාසැල් තුළදී භුක්ති විදීමට ඇති වරප්‍රසාද ලබාගැනීම සඳහා ඔවුන්ගේ උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතුව ඇත. රජයේ දෙපාර්තමේන්තු සමගින් කටයුතු කිරීමේදී ඔවුනට ජාතික හැඳුනුම් පත අත්‍යාවශ්‍යයව ඕනෑ කෙරේ.

### ක්‍රියාත්මක වීම් සඳහා කැඳවුම

1 කුමණ රජයේ කාර්යාලය හෝ කාර්යාල වගකිව යුතුද යන්න පැහැදිලි කරන්න.

2 උප්පැන්න සහතික සහ ඉඩකඩම් හිමිකම් ඔප්පු ආදී ලිපි ලේඛන ප්‍රතිස්ථාපනය කර ගැනීම සඳහා ආධාරක වැඩසටහන් නිර්මාණය කරන්න.

3 ඉන්දියාවේ සිට ආපසු පැමිණෙන්නන්ගේ ලිපි ලේඛන ක්‍රියාවලිය කාර්යක්ෂම හා මනා සංවිධානාත්මක එකක් කරන්න.

4 ආපසු පැමිණෙන ප්‍රදේශයන්හි ලිපිලේඛන ක්‍රියාවලිය කාර්යක්ෂමව හා මනාලෙස සංවිධානය කිරීම සඳහා ජංගම ලියාපදිංචි කිරීමේ ඒකක සංවිධානය කරන්න.

# නිධාන හේතු කාරක ආමන්ත්‍රණයේදී ප්‍රතිපත්තිමය සලකා බැලීම්

යුද විරාමයක් ක්‍රියාත්මකව පැවතුනද, සාම ගිවිසුමක් සඳහා සැලසුම් නිර්මාණය වෙමින් පැවතියද, අර්බුදයට සහ අවතැන්වීම් වලට පාදකවූ නිධාන හේතුකාරක ආමන්ත්‍රනය කොට විසඳීම අවශ්‍ය වන්නේය. මේ සම්බන්ධයෙන්, සාම ගිවිසුම්, ප්‍රජාතන්ත්‍රීය ඡන්ද විමසීම්, අධිකරණ පද්ධතියෙහි සංශෝධන, සුළු ජාතීන්ගේ හිමිකම්, භාෂාමය ගැටළු, පොදු ක්ෂමාව, සමාජ ආර්ථිකමය තත්ත්වයන්, මානව අයිතිවාසිකම් වලට ගරු කිරීම, දේපල හිමිකරුවන් වෙත යලි ලබා දීම, රැකියා අවස්ථා සහ මූලික ජීවන තත්ත්වයනට ලඟා වීමේ ඉඩ ප්‍රස්ථා, ආදීන් වැනි අවධානය අවශ්‍ය කරන්නාවූ පොදු සහ විශේෂිත කරුණු ඇත. විසඳුම් සන්දර්භය තුල අවශ්‍යතාව හා බිය මුලිනුපුටා දැමීම සහ ආරක්ෂාව සැලසීම සඳහා අතීතයේදී සිදුවූ අසාර්ථකත්වයන් සහ අනාගතයේදී මුහුණ පෑමට ඇති අභියෝග හඳුනා ගැනීම අවශ්‍ය කෙරේ.

අවතැන්වූ පුද්ගලයින් සමාජය තුල ප්‍රතිසංකලනය කිරීම, ජාතික ප්‍රතිසන්ධානය සමඟ එකිනෙක පසුපස දිවෙන්නාවූ ක්‍රමික ක්‍රියාවලියක් ලෙස හඳුනා ගත යුතුය. සමස්ත මානව සුරක්ෂිතභාවය පිළිබඳ සන්දර්භය තුළ ආර්ථික, සමාජීය සහ සංවර්ධන පූර්වාගමනයන්, මෙම ක්‍රියාවලියෙහි අන්තර්ගත මූලධාතූන් අතරට ඇතුලත් වේ.

## ක්‍රියාත්මකවීම් සඳහා කැඳවුම

1 පශ්චාත්-අර්බුද දේශපාලනික හා ආර්ථික විසඳුම් වලදී වෙනස් කොට නොසැලකීමට වග බලා ගන්න.

2 නිදහස් හා සාධාරණ මැතිවරණ පවත්වන්න.

3 මානව හිමිකම් සුරැකීම පිළිබඳව, විනිශ්චය කරුවන්, නීතිය ක්‍රියාත්මක කරන්නාවූ නිලධාරීන් සහ වෙනත් නිලධාරීන් සඳහා කඩිනම් පුහුණු කිරීම්ද සහිතව ස්වාධීන අධිකරණයක් සඳහා සහාය වන්න.

4 ස්වාධීන මාධ්‍යයන් සහතික කරන්න.

5 ජාතික, වාර්ගික, ආගමික හෝ භාෂාමය සුළු ජන කොටස් වලට අයත් පුද්ගලයින්ගේ හිමිකම් පිළිබඳ ප්‍රශ්නය සඳහාවූ මුල්ම ජාත්‍යන්තර නීතිමය ලියවිල්ල, සහ සුළු ජාතීන් අවතැන්කිරීමෙන් ආරක්ෂා කිරීම පිළිබඳව

රජයන්ට බලපෑම් ඇතිකරණු ලබන,"විපතට පත් ජනතාවගේ වාර්ගික, ආගමික හෝ ජාතික සංයුතිය වෙනස් කිරීම ඉලක්ක කරගත්/හෝ වෙනස් කිරීමට ලක් කරන්නාවු ක්‍රියාමාර්ග" මත පදනම්ව අවතැන්කිරීම් තහනම් කෙරෙන, අභ්‍යන්තර "අවතැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ මූලධර්ම" ආදියට අනුකූලව සුළු ජාතීන්ට අයත්වන ජන කොටස් වල පුද්ගලයින්ගේ අයිතිවාසිකම් කෙරෙහි විශේෂ අවධානය යොමු කරන්න.

6 පොලිසීය සහ හමුදා පොලිසිය විසින් මානව හිමිකම් වලට ගරු කෙරෙන ලෙස පොළඹවන්න.

7 අවතැන්වීම් වලට පාදක වන්නාවු සමාජීය නොසංසුන්තාවයන් සඳහා ප්‍රතිවිරුද්ධ සමතුලිතතාවයන් ඉදිරිපත් කළ හැකි වන අයුරින් පොදු ජන මට්ටමේ සිවිල් සමාජය ශක්තිමත් කරන්න.

8 රජය පාර්ශවයෙන් සිවිල් සමාජය සමඟ ක්‍රියාත්මක වීම සහ ඔවුන් ශක්තිමත් කිරීම සඳහා සහභාගීත්ව ප්‍රවේශයක් උපයෝගී කර ගන්නා ලෙස ඔවුන් උනන්දු කරවන්න. සම්පත් කළමනාකරණයේදී සහ බෙදා හැරීමේදී රජය විසින් මූල්‍ය වගකීම සහ පාරදෘශ්‍යතාව නිරූපණය වන අයුරින් කටයුතු කිරීම අපේක්ෂා කළ යුතු අතර, අර්බුද කළමණාකරණය සහ අරෝවන් නිරාකරණය සඳහා නෛතික සහ දේශපාලනික රාමුවක් සැපයිය යුතුය. අවතැන්වු ජනතාව සමාජය තුල ප්‍රතිසංකලනය කිරීමත් සමගින්ම, ජාතික ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම විශේෂයෙන්ම සිදු කළ යුතුය.

## පරිසරය

ජලය, වෘක්ෂලතාදිය, වන ආවරණය සහ භූමිය අන්තර්ගතවු පරිසරය කෙරෙහි යුද්ධය බලවත් ලෙස බලපෑම් ඇති කරණු ලැබීය. සමහර අවස්ථාවලදී වාරිමාර්ග පද්ධති කරා ගලා යන ජලය, ඉදිරි ආරක්ෂක වළල්ල, බංකර ආදීන් හේතු කොට ගෙන වෙනස් දිසාවන්ට යොමු වනු ලැබීය. එමනිසා ප්‍රජාවන්ට සහ ජීවනෝපාය මාර්ග සඳහා උපකාරීවීම සඳහා වන පරිසරයෙහි භූමිකාව සඳහා නිසි අවධානයක් අවශ්‍ය කෙරේ. වගා නොකළ භූමි වලින් උපරිම ඵලදායකත්වයක් ලබා ගැනීම සඳහා කන්න ගණනාවක් කල් ගත වනු ඇත.

## ක්‍රියාත්මකවීම් සඳහා කැඳවුම

1 ආපසු යවනු ලබන හා යලි පදිංචි කරවනු ලබන ප්‍රදේශ ද ඇතුලත්වු පරිසරයට වන බලපෑම් පිළිබඳ අධ්‍යයනයන් මෙහෙයවන්න.

2 ආපසු යැවීමේ ක්‍රියාවලියේදී පරිසරයට වන හානි අවම කිරීම සහ අදාල ප්‍රදේශ ප්‍රකෘතිමත් තත්ත්වයට පත් කිරීම සඳහා ක්‍රම ගවේෂණය කරන්න.

## මානුෂවාදී සහාය

සමහර අභ්‍යන්තරව අවතැන්වු පුද්ගලයින් විවිධ හේතූන් නිසා ඔවුන්ගේ වාසභූමි කරා ආපසු නොයෑමට තීරණය කර ඇති බව නිරීක්ෂණය වී ඇත. ඔවුන්, ඔවුන්ගේ නව පරිසරයන් තුළ පදිංචි වී ඇති අතර ඔවුන්ට ආරක්ෂිතයැයි හැගෙන එම ප්‍රදේශවල පාසල් වලට ඔවුන්ගේ දූ දරුවන්ද ඇතුලත් කර ඇත. මේ පිරිසෙන් බොහෝ අය පිට දේශයන්ගෙන් ලැබෙන මුදල් මත යැපෙති. අවතැන්වීමේ ප්‍රතිපලයක් ලෙසින් බොහෝ අයගේ සමාජ අගයන් වෙනස්ව ගොස් ඇති අයුරක් පෙනේ. වෙනත් විෂමතාවයන්ද ඇත්තේය. කෘෂිකාර්මික සහ ධීවර ප්‍රජාවන් තුළින් පැමිණෙන පුද්ගලයින් සේම එක් එක් දිස්ත්‍රික්කවල පුද්ගලයින්ද, ආපසු පැමිණීම වෙනස් වු ආකාර වලින් දකී. එම නිසාම ගන්නා විසඳුම් මේ විවිධ පර්යාලෝකයන් සිත්හි තබාගෙන නිර්මාණය කළ යුතුය.

අවතැන්වු පුද්ගලයින් ආපසු පැමිණීමේදී හෝ යලි පදිංචි වීමේදී ඔවුනට මානුෂවාදී සහයන් කරා ලඟාවීමේ ඉඩ ප්‍රස්ථා අවශ්‍ය කෙරේ. එවැනි සහයන් සැලසීම ජාතික බලධාරීන්ගේ මුලික රාජකාරියක් සේම වගකීමක්ද වන්නේය. එලෙසින්ම ඔවුන්ගේ පාලනය යටතේ පවත්නා ප්‍රදේශයන්හි සිවිල් ජනතාව පිළිබඳ වගකීම ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය (LTTE) වෙත පැවරේ. මෙම බලධාරීන් දෙකොටසම සහාය සැලසීම් ක්‍රියාවට නැංවිය යුත්තේ මානුෂිකත්වය පිළිබඳ මුල ධර්මයනට අනුකූල වන ලෙසින් සේම, අපක්ෂපාතී හා කිසිදු වෙනස්කොට සැලකීමකින් තොර බව සනාථ වන්නාවු අයුරිනුත්ය. ඔවුන් පිහිටාධාර සැපයීම සඳහා ඉදිරිපත්වීමට අකමැති වන්නේ නම් එවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා හැකියාවක් සහිත සහ ඒ සඳහා ඉදිරිපත් වන්නාවු වෙනත් සංවිධාන වලට ඒ සඳහා ඉඩ ප්‍රස්ථාව ලබා දිය යුතුය. (වැඩි දුර සාකච්ඡාවන් සඳහා පහත සඳහන් කර ඇති "සම්බන්ධීකරණය" පිළිබඳ ඡේදය බලන්න.)

## ක්‍රියාත්මකවීම් සඳහා කැඳවුම

1. අවතැන්වූ පුද්ගලයින්ගෙන් සමහර අය ආපසු ඔවුන්ගේ නිවාස වෙත යන අතර අනෙකුත් අය නව ප්‍රදේශයන්හි යලි පදිංචි වන බව පිළිගන්න.

2. ආපසු යැවීමට ඉඩ ප්‍රස්ථා ඇති ප්‍රදේශවල සංචාරය කරමින් එම ප්‍රදේශවල තත්ත්වයන් ස්වෛරීව තක්සේරු කරන්න.

3. අවතැන්වූ ප්‍රජාවට අභිමානයෙන් යුතුව ඔවුන්ගේ නිවාසවලට හෝ යලි පදිංචි කරනු ලබන ස්ථානවලට ගමන් කිරීමට හැකිවන අයුරින්, ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය සහිතව, සංවිධානාත්මක ප්‍රවාහනයක් සඳහා සූදානම් වන්න.

4. ගමනාන්තරයේදී අවතැන්වූ පුද්ගලයින් හට සහාය සහ ආරක්ෂාව සැලසීම සහතික වන අයුරින් වැඩ සටහන් නිර්මාණය කරන්න.

5. අවතැන්වූ ජනතාව ආපසු ඔවුන්ගේ නිවාසවලට හෝ යලි පදිංචි කරනු ලබන ස්ථාන වලට පැමිණීමෙන් පසුව, ඔවුනට සහ සත්කාරක ප්‍රජාව සඳහා කිසිදු වෙනස්කොට සැලකීමකින් තොරව මානුෂවාදී සහායයන් ලබා දෙන ලෙසට වග බලා ගන්න.

6. ආධාර ආයතන, රජයන්, ජාත්‍යන්තර සංවිධාන සහ වෙනත් ක්‍රියාකාරකයින් විසින් ක්‍රියාත්මක වන මානුෂවාදී ක්‍රියාන්විතයන් සඳහා විනය නීති සංග්‍රහයක් ස්ථාපිත කිරීම සඳහා බලපෑම් කරන්න.

7. මානුෂවාදී ප්‍රතිපත්තීන්ගේ සමානාත්මතාවය සහ අනුරූපතාවය සහතික කිරීම සඳහා සහ දේශපාලන න්‍යාය පත්‍රයන් මගහැරීම සඳහා, ආධාර සපයන්නන් සමඟ නිතිපතා උපදේශන රැස්වීම් කැඳවන්න.

## කාන්තාවන් සහ ළමයින්

අර්බුදය තුලින් වඩාත් පීඩාවට ලක්වූවෝ කාන්තාවන් සහ ළමයින්ය. ඔවුන් හට විශේෂ ඉඩ සැලසීම් පොරොන්දුවී තිබුණද, ඒවා සැම විටම ක්‍රියාවට නැගුනේ නැත. වැන්දඹුවන් සහ ස්ත්‍රී මූලික ගෘහයන්, පවතින්නාවූ සංස්කෘතිකමය සන්දර්භය තුල, ඉතා අප්‍රසන්න ලෙසින් කොන් කරණු ලැබ ඇති නිසා, විශේෂ ඉඩ සැලසීම් නොකළ හොත් ඔවුන් තවදුරටත් පීඩාවට ලක්වීම සිදුවනු ඇත. කාන්තාවන්ට සමාජීය හා ආර්ථික ඉඩ ප්‍රස්ථා මද බව හේතුවෙන් සහ ලිංගික අතවර සහ ලිංගිකත්වය

පාදකවු ප්‍රචණ්ඩත්වය නිසාම, ඔවුන් හට ආපසු යෑම සහ යලි පදිංචි වීම සම්බන්ධ සන්දර්භය තුලදී සුවිශේෂිවු අභියෝග රැසකට මුහුණ පෑමට සිදුවේ.

කාන්තාවන්, තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි කොටස් කරුවන් විය යුතුය. කාන්තාවන් සහ ළමයින් ගේ ආරක්ෂාව පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා විශේෂ අවධානයක් අවශ්‍ය කෙරේ.

බඳවා ගැනීම් පිළිබඳ තර්ජනය මුළුමණින්ම පහව නොගියද, අඩු වයස් සටන් කරුවන් පුනරුත්ථාපනය ආර්ම්භවී ඇත. මෙය ළමුන්ගේ ආරක්ෂාව පිළිබඳ බලවත් අභියෝග ඉදිරිපත් කරයි. මීට අමතරව, පාසල් යාමට සහ අධ්‍යාපනය සඳහා පහසුකම් නොමැති බව, සෞඛ්‍යමය ගැටළු, මන්දපෝෂණය, ලිංගික සහ වාණිජමය සූරා කෑම් ආදීන් හේතුවෙන්, ඔවුන්ගේ ළමා කාලය සහ ළමා අයිතිවාසිකම් අහිමි වීම හේතුවෙන්, ළමයින් අවශ්‍ය පොත්පත්, ඇඳුම් පැලදුම් ආදී පාසල් උපකරණ මිලදී ගැනීමට අපොහොසත් වීම නිසාම කිසි දිනෙක පාසලකට ගොස් නොමැත. එසේ නොමැති නම් මගදී පාසල් නොගොස් නතරවී ඇත. සමහර ළමුන් ඔවුන්ගේ පවුල් නඩත්තු කිරීම සඳහා උපකාර වීම සඳහා රැකියාවන්හි යෙදීම පිණිස පාසල් වලින් ඉවත්ව ඇත. ආරක්ෂක තත්ත්වයන් සහ ප්‍රවාහනයද මේ සඳහා ඉවහල්වු වෙනත් සාධකයන්ය. ළමයින් ආපසු පාසල් වෙත යොමු කිරීම සඳහා ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුය.

## ක්‍රියාත්මකවීම් සඳහා කැඳවුම

1 ආපසු යවනු ලබන හෝ යලි පදිංචි කරනු ලබන ප්‍රදේශවල ප්‍රජාවන් තුලට ඔවුන් සංකලනය කිරීම උනන්දු කරවන වැඩ සටහන්, කාන්තා මුලික ගෘහයන් උදෙසා නිර්මාණය කරන්න.

2 තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි කොටස් කරුවන් වීමට ඔවුන්ට හැකිවන අයුරින් සහ ඔවුන්ගේම සංවර්ධන කටයුතු සඳහා තීරණ ගැනීමේ ඉඩ ප්‍රස්ථාව ලැබෙන අයුරින්, කාන්තාවන් ග්‍රාමීය පුරුත්ථාපන කමිටු වලට සහභාගී කරවන්න.

3 ලිංගික හා ලිංගිකත්වය පාදකවු ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සිද්ධි අධීක්ෂණය හා ලේඛනගත කිරීම සිදු කරන්න.

4 කාන්තා අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු ප්‍රචලිත කරන්න. ලිංගික හා ලිංගිකත්වය පාදකවු ප්‍රචණ්ඩත්වයන්ට ගොදුරු වුවන් පිළිබඳව කටයුතු කිරීම සඳහා ව්‍යුහයන් සංවිධානය කරන්න.

5 පවුල්වල සාමාජිකයිනට එක්ව විසීමට හැකිවන අයුරින් වැඩසටහන් නිර්මාණය කරන්න.

6 අවතැන්වුවන් හට ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සිටින ස්ථාන සහ ඔවුන්ගේ තත්ත්වයන් පිළිබඳව තොරතුරු සැපයෙන පුහුණු වැඩ සටහන් වලට සහාය සපයන්න.

7 අවතැන්වූ අවස්ථාවේදී මගහැරී ගිය ළමයින් සොයා ගැනීම සඳහා පවුල්වලට උදව් කරන්න.

8 පුහුණුවූ ප්‍රජා සේවකයින් සහ වෙනත් රැකවරණ සලසන්නන් මගින් අවශ්‍යවූ විටදී, කාන්තාවන් සහ ළමයින් සඳහා මනෝ-සමාජීය සහාය සහ උපදේශනයන් සලසන්න.

9 එසේ හැකිවන්නේ නම්, ළමයින් ආයතන තුළ රැඳවීම මගහරින්න. දෙමව්පියන් දෙපලම අහිමිවූ ළමයින්, ව්‍යාප්ත වූ පවුල් තුලින් හදා වඩා ගැනීම උනන්දු කළ යුතුය.

10 පෙර ළමා-සටන්කරුවන් පුනරුත්ථාපනය කිරීම අධීක්ෂණය කරන්න. මෙම කටයුත්ත සඳහා නිල පැවරුම ලබා සිටින UNICEF ආයතනය සහ දෙමළ සහන සංවිධානය (TRO) මේ සඳහා වග කිව යුතු වන්නේය.

11 වරද කරුවන් වෙත පීඩනයක් ඇති කිරීම සඳහා බාල වයස් කරුවන් බඳවා ගැනීම් පිළිබඳව බලධාරීන් වෙත පැමිණිලි කරන්න.

12 අධ්‍යාපනය ළමයින්ගේ ප්‍රමුඛතාවයක් කරන්න. ළමයින් ආපසු පාසල් වෙත යොමු කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. අතපසුවූ අධ්‍යාපනය සඳහා අතිරේක පංති පැවැත්වීම, පාසල් උපකරණ සපයා දීම, සහ පාසල් ප්‍රතිසංස්කරණය කිරීම ආදිය මගින් ඔවුන් ආපසු පාසල් වෙත ගෙන ඒම කඩිනමින් සිදු කිරීම සඳහා සියලුම පරිශ්‍රමයන් දැරිය යුතුය.

13 ශ්‍රී ලංකා රජය සහ ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය (LTTE) අතර 2003 වසරේ ජුනි මාසයේදී, එකඟතාවයකට පැමිණි, ළමයින් සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම සඳහා පුළුල් සහායක් උනන්දු කරවන්න. මෙම සැලැස්ම, අන්තරායකර සේවයෙහි යෙදී සිටින්නාවූ ළමයින්, වීදි ළමයින් සහ ළමා සොල්දාදුවන් වැනි ඉතා පහසුවෙන් පීඩාවන්ට ලක්වීමේ ඉඩ සහිත ළමයින්ගේ අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කරණු ලබයි.

## සම්බන්ධීකරණය

සියලුම ක්‍රියාකරුවන්ගේ ඒකමතික මතය වනුයේ, අවතැන්වූවන් වෙනුවෙන් වූ ප්‍රයත්නයන්ගේ සම්බන්ධීකරණය සිදුවිය යුත්තේ දිස්ත්‍රික් මට්ටමෙන් බවටය. එක් එක් දිස්ත්‍රික්කය සඳහා ඒවාටම ආවේණික විශේෂ අවශ්‍යතාවයන් ඇති නිසා මෙය ප්‍රයොජනවත් බව පෙනී යයි. සියලුම ක්‍රියාකරුවන්ගේ ප්‍රයත්නයන්ගේ සඵලත්වයට සහ කාර්යක්ෂමතාවය සඳහා ඒවායේ සංකලනය සහ සම්බන්ධීරණය අවශ්‍ය කෙරේ. වගකීම පිළිබඳවද මෙය එලෙසින්ම වේ. උපකාර කරන්නට අභිමත වන්නන්ගේ ප්‍රයත්නයන් සැමවිටම උපකාර ලබන්නන් හට වගකිවයුතු ලෙසින් විය යුතුය. සහයෝගීතාවයන් සැලසුම් කළ යුත්තේ ඒවායේ බලපෑම් තුලින් කිසිදු ප්‍රජාවකට හානියක් සිදු නොකෙරෙන අයුරින්ය. සත්කාරක ප්‍රජාවන් තුලට යලි සංකලනය කිරීම ආමන්ත්‍රණය කළ යුත්තේ මනා සැලසුම් සහිතවය.

අවතැන්වූවන් ආපසු පැමිණීමෙන් පසුව, "ඒකාබද්ධ සහයෝගිතා යෝජනා ක්‍රමය"- (UAS) යටතේ සුදුසුකම් ලබන්නාවූ ආපසු පැමිණෙන හෝ යලි පදිංචි කරනු ලබන සෑම පවුලක් සඳහාම මූල්‍යාධාර ("ජීවන සහණාධාර" යනුවෙන් හඳුන්වනු ලබන) ලබාදීමේ ප්‍රතිපත්තියක් රජයට ඇත්තේය. 2003 වසරේ පෙබරවාරි මස සිට ක්‍රියාත්මකව පවතින්නාවූ, ශ්‍රී ලංකා රජයේ, දැනට භාවිතයේ පවතින මෙහෙයුම් නිර්ණායකයන් යටතේ සුදුසුකම් ලබන්නාවූ පවුල් වශයෙන් සලකණු ලබන්නේ යුද විරාම ගිවිසුම අත්සන් කළ දිනයේ සිට ඔවුන්ගේ නීත්‍යානුකූල හිමිකම් ඇත්තාවූ (හෝ රජය විසින් ප්‍රදානය කරණු ලැබූ) ඉඩම්වලට ආපසු පැමිණ යලි පදිංචි වන්නාවූ පවුල්ය. මීට අමතරව සහණාධාර සඳහා සුදුසුකම් ලැබීමට නම් පවුලෙහි ආදායම මසකට රුපියල් 2,500 ට වඩා අඩු විය යුතුය. ඒකාබද්ධ සහයෝගිතා යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන පවුලකට රුපියල් 25,000 ක්වූ මුදලක් ආධාර ලෙස ලැබේ. නමුත් බොහෝ අය මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් නොලබති. අවතැන්වූවන් සඳහා වන සහාය සමානුගාමී රටාවක් අනුගමනය නොකරයි. මෙය ඔවුන් අතර සිටින බොහෝ අයට සැලකිය යුතු ගැටළු වලට හේතු කාරකව ඇත. අවතැන්වූ අවස්ථාව මෙහිදී මතභේදයට හේතු කාරකයක් ලෙස පෙනේ. සෑම අවතැන්වූවකුම එකම ප්‍රතිවිපාක අත්විඳින නිසා මෙය සම්මතයකට අනුව නිශ්චය කළ යුතු අතර ඔවුන්ගෙන් කිසිම කෙනෙකු කොන් කිරීමක් නොකළ යුතුය.

ආපසු යැවීම සංකීර්ණ ක්‍රියාවලියක් වන බැවින් එය සැලසුම්කරණයේදී මහත් සැලකිල්ලක් ගත යුතු වන්නේය. මෙම විෂයට සම්බන්ධ මතභේදයට තුඩු දෙන්නාවූ කරුණු ගණනාවක් ඉහතදී සඳහන් කරනු ලැබීය. ගම පුනරුත්ථාපනය කිරීමේ සැලසුම් ආපසු පැමිණෙන්නන් එන අවස්ථාවට පෙර සුදානම්ව තිබිය යුතුය. එලෙස ඔවුන්ගේ ආපසු පැමිණීම ඔවුන්ගේ අවතැන්වීමේදී තරම් සිත් කම්පා කරවන සුළු නොවනු ඇත. අවසන් වශයෙන්, ප්‍රතිඵලදායක වන්නට නම් විසඳුම් කල් පවත්නා ඒවා විය යුතුය.

අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් ආපසු යැවීම් සඳහා විශාල භූමිකාවක්, මාධ්‍ය වලට සිදු කළ හැකිය. බොහෝවිට ආපසු යැවීම් ආපහසුවන අන්දමේ රිනාත්මක චිත්‍ර මවා පෙන්වනු ලබයි. රජය සහ වෙනත් ක්‍රියාකාරකයින් මාධ්‍ය සමඟ යහපත් සාකච්ඡා පැවැත්වීම වැඩදායී වනු ඇත. අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්ගේ අයිතීන්ට අනුබල දීම ඉතා වැදගත්ය. ඔවුන් ශ්‍රී ලාංකීය පුරවැසියන් වන අතර අනෙකුත් සහෝදර පුරවැසියන් ලෙසින්ම සියලුම අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතිය ඔවුනට ඇත්තේය. මාධ්‍යවලට නිර්මාණාත්මක ලෙස මෙහිදී භූමිකාවක් කළ හැක.

## ක්‍රියාත්මක වීම් සඳහා කැඳවුම

1. ආපසු පැමිණෙන අවතැන්වූ පුද්ගලයින් සහ ප්‍රදේශයේ වැසියන් අතර මැදිහත්වීම් සහ ප්‍රතිසන්ධානය සඳහා ප්‍රයත්නයන් හඳුන්වා දෙන්න.

2. අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් හා ආපසු පැමිණෙන හෝ යලි පදිංචි කරවනු ලබන ප්‍රදේශවල ජනතාව අතර උපදේශනයන් කැඳවමින් ප්‍රජාවන් අතර ඇතිවීමේ අවදානම සහිත අර්බුද හඳුනා ගෙන ඒවා මඟහරවා දැමීමට උපකාරී වන්න.

3. දිස්ත්‍රික්ක මට්ටමේ සම්බන්ධීකරණ මඩුල්ලක් ස්ථාපිත කරන්න. මෙම මඩුල්ල සඳහා නියෝජිතයින්, රජයෙන්, රාජ්‍ය නොවන අංශයෙන්, හමුදාවලින්, ග්‍රාමීය පුරුත්ථාපන කමිටුවලින්, අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් ගෙන් සහ වෙනත් අදාල ක්‍රියාකරුවන් ගෙන් විය යුතුය. මේ අනුව අදාල සියලුම පාර්ශවයන් මෙම ක්‍රියාවලියෙහි හිමිකරුවන් වන අතර වගකීම් පිළිබඳ ඉඩ ප්‍රස්ථා වඩා ප්‍රබල කෙරෙනු ඇත.

4. "ඒකාබද්ධ සහයෝගිතා යෝජනා ක්‍රමය" මගින් වේවා වන්දියක් ලෙස වේවා, ඔවුන් ඈත අතීතයේදී අවතැන්වුවන් වුවද, ඉතා මෑතදී අවතැන්වුවන් වුවද, සියළුම අවතැන්වුවන් හට සමානතාවයෙන් යුතුව සහාය සලසන්න. අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්, නිර්ණායකයන් පිළිබඳව හා ඔවුන් සුදුසුකම් ලබන අයුරු පිළිබඳව දැනුවත් කළ යුතුය.

5. පොදු මහජනයා හට ආපසු යැවීම සහ යලි පදිංචි කරවීම පිළිබඳ නිවැරදි ස්වරූපය දැක්වීම සඳහා රජය සහ අනෙකුත් බලධාරීන් විසින් මාධ්‍ය සමග නිතිපතා සාකච්ඡා පැවැත්වීම උනන්දු කරවන්න.

## ආර්ථිකය සහ සංවර්ධනය

තිරසාරත්වය ලඟාකර ගත හැකිවන අයුරින් සංවර්ධන ක්‍රියාදාමය තුලට සහණාධාර සැපයීම ඒකාබද්ධ කිරීම සඳහා තව බොහෝ දේවල් කළ යුතුව ඇත. යුදමය ආර්ථිකයක සිට සාම ආර්ථිකයක් කරා යැමේ සංක්‍රාන්ති අවස්ථාවේදි ප්‍රශ්න ගණනාවක් ඇසීම අවශ්‍යවේ. ව්‍යුහාත්මක දුගීභාවය සහ යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවු දුගීභාවය හසුරුවන්නේ කෙසේද? ඒවා සුවිශේෂි වන්නේද එසේ නොමැති නම් එකිනෙකට සම්බන්ධ වුවන්ද? උතුර සහ දකුණ අතර ඇති පරස්පරතාවය තවත් එක් මත භේදයට ලක්වු කරුනකි. සංවර්ධනය සඳහා සාමය කොන්දේසියක් වන්නේද එසේ නොමැති නම් සාමය සඳහා සංවර්ධනය කොන්දේසියක් වන්නේද? ඒකාබද්ධ ප්‍රවේශයක් මේ සඳහා තිබිය හැකිද? ආදායම් ඉපැයුම් ප්‍රයත්නයන් පිළිබඳව සොයා බැලීම අවශ්‍ය වන අතර ඒවා දිගු කාලීන සංවර්ධන ව්‍යාපෘති වලට සම්බන්ධ කළ යුතුය.

අවතැන්වු ජනතාවට පැරණි කුසලතාවයන් සහ අලුත් කුසලතාවයන්ද වර්ධනය කර පවත්වා ගැනීම ඔවුන් අවතැන්වීමට ලක්වු ප්‍රදේශයන් තුලදී හෝ ඔවුන්ගේ පෙර වාසභූමි හා නිවාස වලට ආපසු පැමිණීමෙන් පසුව ඔවුන්ගේ තිරසාර පැවැත්ම සඳහා අවශ්‍ය කෙරේ.

පශ්චාත්-අර්බුද ව්‍යාපාරය ඉතා සමෘද්ධිමත් එකකි. පශ්චාත් අර්බුද අංශයන්හි ක්‍රියාවන්හි නියැලි ජාත්‍යන්තර සංවිධාන අතර පවත්නා තරඟකාරීත්වය එම ක්ෂේත්‍රයට ආවේණිකවු ගතිකත්වයක් ස්ථාපිත කරයි. ප්‍රාදේශීය දැනුම කොන් කිරීම සහ අර්බුදයන්ගේ දේශපාලනමය මානයන් ග්‍රහණය කර ගැනීමට අපොහොසත්වීම බොහෝ විට එම තරඟකාරීත්වයේ අතුරු ඵලයන්ය. මෙය යොමුවන්නේ මානුෂවාදී සහාය සැපයීමේදී ශ්‍රී ලංකාවෙහි ජනතාව වෙත වගකිවයුතු ආකාරය පිළිබඳ කරුණාටය. ලොව පුරා ඇති අර්බුදයන් එකිනෙකට වෙනස්වන අතර පශ්චාත් අර්බුද තත්ත්වයන් හැසිරවීමේ තනි නිශ්චිත සැලැස්මක් නොමැත. ජාත්‍යන්තර ඒජන්සි වගකිව යුත්තේ ඔවුන්ට ආධාර සපයන්නන් වෙත පමණක් බවද ඔවුන්ගේ ක්‍රියාකාරකම් සිදු කෙරෙන රාජ්‍යවල ජනතාවට නොවන බවටද සාවද්‍යවු මතයක් පවතී. ප්‍රාදේශීය හැකියාවන් ගොඩ නැගීම සහ ආයතන ගොඩ නැගීම ප්‍රතිපත්තිමය මට්ටමේදී සේම සාමාන්‍ය පොදු ජන මට්ටමේදීද පිටිවහලක් වන්නේය.

### ක්‍රියාත්මකවීම් සඳහා කැඳවුම

1. ආපසු යැවීම සහ යලි පදිංචිකිරීම සම්බන්ධව සමාජීය අවහිරතාවයන් තවත් වසර ගණනාවක් තෙක් පැවතිය හැකි බව හඳුනා ගනිමින් දිගුකාලීන යලි සංකලනය කිරීමේ ක්‍රියාකාරකම් සැලසුම් කරන්න.

2. අවතැන්වුවන් හට රැකියා අවස්ථාවන් සොයා ගැනීමට සහ ස්වශක්තියෙන් නැගී සිටීමට ඉඩ සැලසෙන අයුරින් ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කරගැනීම

පිණිස යලි පුහුණු කිරීම සඳහා හෝ නව කුසලතා ඉගැන්වීම සඳහා මුදල් උපයෝජනය කරන්න.

3 අර්බුද පවත්නා ප්‍රදේශවල ප්‍රජාවගේ සමාජ-ආර්ථිකමය ව්‍යුහයන් දිරිගන්වමින්, ඒ තුලින් ප්‍රජාවෙහි සාමාජිකයින් වෙත පලා යාම සඳහා යොමුවන්නාවු පීඩනයන් අඩු කර එහි ප්‍රතිඵලයක් ලෙස තව දුරටත් අවතැන්වීම වලක්වාලමින් ශක්තිමත් ප්‍රකෘති තත්ත්වයට පත්කිරීමක් සඳහා මාර්ගය පහසු කරවන්නාවු වැඩ සටහන් සැලසුම් කරන්න.

4 ඔවුන් වෙනුවෙන්ම තීරණ ගැනීම සඳහා සහ අවසානයේදී ඔවුන්ට ස්වශක්තියෙන් නැගී සිටීමට හැකි පරිදි අවතැන්වූවන් බලගන්වන්න.

5 යුද්ධයෙන් පරිහානියට පත් ප්‍රදේශයන් ප්‍රතිනිර්මාණය කිරීම සහ පුනරුත්ථාපනය කිරීම් සඳහා වෙන් කරණු ලබන මුදල් අධීක්ෂණය කිරීම ප්‍රාදේශීය ප්‍රජාව තුලින් සිදු කිරීම ස්ථාපනය කරන්න.

## ප්‍රතිපෝෂණය සහ අධීක්ෂණය

ආපසු පැමිණෙන්නන්ගෙන් ප්‍රතිපෝෂණයක් ලබා ගැනීමේ යන්ත්‍රනයන් ස්ථාපිතව නොමැත. ක්‍රියාවලිය අධීක්ෂණය කිරිමට හා ඇගයීම සඳහා සහ කවුරුන් වග කිව යුතුද යන්න සඳහාද කිසිදු යන්ත්‍රනයක් නොමැත. සහභාගීත්ව අධීක්ෂණය එක් අදහසක් වුවද, එය ක්‍රියාත්මක කිරීම සඳහා අභිමතයක් අවශ්‍ය කෙරේ. දැනට "පූර්ණ සංකලනය" තක්සේරු කිරීම සඳහා ස්ථාපිත දර්ශකයන් නොමැත. මානව හිමිකම් උල්ලංඝණය වීම් පිළිබඳව කටයුතු කිරීම සඳහා යන්ත්‍රනයන් ස්ථාපිත කරමින් මානව හිමිකම් අධීක්ෂණයද න්‍යාය පත්‍රයට ඇතුලත් කළ යුතුය.

## ක්‍රියාත්මකවීම් සඳහා කැඳවුම

1 ඉහතදී නිර්දේශ කර ඇති අයුරු, ආපසු පැමිණීම, යලි පදිංචි කිරීම සහ පුනරුත්ථාපනය සඳහා දිස්ත්‍රික් සම්බන්ධිකරණ මඩුල්ලක් සාදන්න. මෙම මඩුල්ල සියල්ලගෙන් සමන්විත වුවක් හෙයින්, සහභාගීත්ව අධීක්ෂණ ක්‍රියාවලියක් ස්ථාපති කළ යුතුය.

2 දිස්ත්‍රික්ක පදනමේ පිහිටුවා ඇති සංධානයන් හට විධිමත් කාල පරාසයනට අනුව ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා විවිධවු ක්‍රියාකාරකයින් රැස්කිරීම පිළබඳව වැදගත් භූමිකාවක් සිදු කළ හැකි බව පිළිගන්න.

3 ආපසු පැමිණෙන හෝ යලි පදිංචි කරවනු ලබන ප්‍රදේශවල මානව හිමිකම් පිළිබඳ තත්ත්වයන් අධීක්ෂණය කිරීම සඳහා යන්ත්‍රනයන් ස්ථාපිත කරන්න.

4 අවසන් වශයෙන් අවතැන්වූ පුද්ගලයින් වෙතම ඔවුන්ගේ ආපසු පැමිණීමේ ක්‍රියාවලියෙහි අධීක්ෂණය සිදු කිරීම භාර දෙන්න.

# තෙවන කොටස

## නිගමනය

සමූහ අවතැන්වීම් පිළිබඳ අති විශාල ගැටළුවට උරදීම සහ අභ්‍යන්තරව අවතැන්වූවන් සඳහා විසඳුම් පිළිබඳව කටයුතු කිරීම සංකීර්ණ කර්තව්‍යයකි. මෙහිදී ආරම්භක ස්ථානය වනුයේ, අන්තරායකාරී අවස්ථාවන් සමනය කිරීම, මානුෂවාදී සහනයන් සැලසීම මගින් පමණක් අපේක්ෂා නොකළ හැකි බව වටහා ගැනීමය. අර්බුදයක් මගින් අවතැන්වීම් හටගත් විටදී, සුරක්ෂිත හා සාධ්‍ය ලෙස ආපසු යැවීම හෝ යලි පදිංචි කරවීමට හැකි වන්නේ සහ ප්‍රතිඵලදායී වන්නේ, සංවර්ධන වැඩසටහන් කැටුව සිදු කරන්නාවූ සාමය යලි ස්ථාපිත කිරීම මගින් පමණි. ප්‍රතිඵලදායී වීම සඳහා, අර්බුද සඳහා වන විසඳුම්, මානව හිමිකම් වලට ගරු කිරීම සහ ප්‍රජාතන්ත්‍රීය සහභාගීත්වය සඳහා දිරි ගැන්විය යුතු අතර අවතැන්වූ සහ අනෙකුත් බලපෑමට ලක්ව ඇති ජනතාව සඳහා ආර්ථිකමය ඉඩ ප්‍රස්ථා සහතික කෙරෙන්නාවූ වැඩ සටහන් සමග සමගාමී විය යුතුය.

ශ්‍රී ලංකාවෙහි රජය ආපසු යැවීම් සඳහා බල කිරීමක් නොකළද, සහණ සැලසීම්, ආපසු පැමිණීම් පොළඹවා ඇත. මූලික වශයෙන්ම ආපසු යෑම් ස්වේච්ඡාවෙන් විය යුතුය. ආපසු පැමිණීමෙන් පසු ආරක්ෂාව සැලසීම සඳහාද විශේෂ අවධානයක් අවශ්‍ය කෙරේ. ඔවුන්ගේ ඉඩම් සහ පෞද්ගලික දේපල වෙනත් අය හිමි කර ගෙන ඇති බව සහ එවැනි මතභේද විසඳීම සඳහා අධිකරණ පද්ධතියක් ස්ථාපිතව නොමැති බව දත් විට ආපසු පැමිණෙන්නන්හට ඔවුන් අවතැන්වීමේදී මෙන්ම ආපසු ඒමේදීද සිත් කම්පා කරවන්නක් විය හැක. සාමය ඇති වුවද, ගමේදී හෝ නගරයේදී ඉහතදී නොවිසඳුන ගැටුම් පිළිබඳව ආපසු පැමිණෙන්නන් ඉලක්ක බවට පත් විය හැක. මෙවන් අවස්ථාවන්හිදී විවිධ වාර්ගික, ආගමික සහ ජාතික ප්‍රජාවන් සමඟ ඉඩම් හා දේපල පිළිබඳව, සාමකාමී සහ සමානාත්මතාවයෙන් යුත් විසඳුම් වලට දිරි දීම සඳහා ඔවුන් අතර ප්‍රතිසංධානය උනන්දු කරවීම වැදගත්ය.

හැකි ඉක්මණින් ඇමතිය යුතු අනෙක් බරපතලම ප්‍රශ්නය වන්නේ බිම් බෝම්බයි. එය, ආපසු ඒම, වගා කටයුතු, ආර්ථික සංවර්ධනය, අධ්‍යාපනය සහ වෙනත් බොහෝ සමාජීය සහ ආර්ථික ප්‍රශ්න වලට සම්බන්ධ වන්නේය. සංවර්ධනය සමඟ සහන සැලසීම ඒකාබද්ධ කිරීම වැදගත්ය. හදිසි අවස්ථාවන්හි සහාය සැලසීම සහ සංවර්ධන වැඩ සටහන් සැලසුම් කිරීම සමගාමීව ක්‍රියාත්මක විය යුතුය. සහන සැලසීමේ වැඩ සටහන් නිර්මාණය කළ යුත්තේ සංවර්ධන කටයුතු සඳහා පාදමක්

සැලසෙන අයුරිනි. අවතැන්වූවන් අතර කුසලතා හිඟවීම නිවැරදි කළ යුත්තේ යලි පුහුණු කිරීම් තුලින් හා නව කුසලතා ඉගැන්වීම මගිනි.

ආධාර ලබා දෙන්නන් සහ දේශපාලන විසඳුම් සඳහා ගනුදෙනුවෙහි නියැලියන් අතර සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් එසේ ආධාර ලබා දීම සඳහා වන මැදිහත්වීම් සාම ක්‍රියාවලියට රුකුලක් වන අන්දමින් සිදු විය යුතුය. ආධාර වැඩසටහන් අර්බුදකාරී තත්ත්වයට පෙරදී සමාජයට කරදරයක්ව තිබූ සංවර්ධන ගැටළු ආමන්ත්‍රණය කිරීම අවශ්‍ය කෙරේ.

වැදගත් ලෙස සිහි තබා ගත යුතු කරුණ වන්නේ අර්බුද විසින් ඉතිරි කර යන්නේ හදිසි අවස්ථා සහනාධාර සහ ඉන් පසුව සංවර්ධන සහයෝගීතාවය සැපයීමෙන් පමණක් සමනය කළ නොහැකි ඉතා ගැඹුරු ආපදාවන් බවය. මේ සඳහා වන ප්‍රයත්නයන් ඒකාබද්ධව සිදු කළ යුතු අතර වැලැක්වීම, ආරක්ෂාව, යලි ඒකාබද්ධ කිරීම සහ දේපාලනික ප්‍රතිසන්ධාන ගත වීම සඳහාද යන්ත්‍රනයන් පැවතිය යුතුය. ශ්‍රී ලංකාවෙහි පවත්නා තවත් එක් අභියෝගයක් වන්නේ අවතැන්වූවන් සඳහා එලදායී විසඳුම් සඳහා දිරි දීමට උත්සාහ කිරීමේදී සම්බන්ධීකරණය පිළිබඳ ගැටළුවට මුහුණ දෙන්නේ කෙසේද යන්නය. නිලධාරිවාදය, ආයතනික විරුද්ධවාදීකම් සහ මුදල් නොමැතිවීම බොහෝ විට සහයෝගීත්වයෙහි කාර්ය සාධනය අවහිර කරණු ලැබීය. සියළුම ක්‍රියාකාරකයින්ගේ කැපවීම සහ වගකීම මෙම ක්‍රමෝපායෙහි ක්‍රියාත්මක බව සඳහා අවශ්‍ය වේ. එසේ වුවොත් පමණක් නියම සාමය, සංවර්ධනය සහ යුක්තිය සඳහා අවස්ථා සැලසෙනු ඇත.

# පළමු ඇමුණුම

## ක්‍රමවේදය

## නැවත පැමිණීම, නැවත පදිංචිකරවීම, පුනරුත්ථාපනය සහ සංවර්ධනය සඳහා වෘත්තියෙහි නියැලියන්ගේ උපදේශන කට්ටලය

මෙය අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් නැවත පැමිණීම, නැවත පදිංචිකරවීම, යලි ඒකාබද්ධ කිරීම, ප්‍රකෘතිමත් තත්ත්වයට ගෙන ඒම, පුනරුත්ථාපනය සහ සංවර්ධනය ආදියෙහි නියැලි සියළුම ක්‍රියාකාරකයින් සඳහා ප්‍රායෝගික මග පෙන්වීමක් වන්නේය. මෙය මාර්ගෝපදේශ මුලධර්ම, මෙවලම් කට්ටලය සහ වෙනත් උපාදාන, අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්ගේ අවශ්‍යතා ඇමතීම සඳහා භාවිතයට පහසු ලෙස සැකසු මෙවලම් ලෙසට පරිවර්තනය කිරීම සඳහා උපකාරී වනු ඇත. මෙය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් සැලසුම් කර සකසනු ඇත. එය වැඩමුළු, මාධ්‍ය ආදීන් තුලින් ප්‍රචලිත කිරීම සහ ප්‍රවර්ධනය කෙරෙනු ඇත. වෘත්තියෙහි නියැලියන්ගේ මෙවලම් කට්ටලය මුලික ලියැවිල්ලක් ලෙස ප්‍රවර්ධනය කෙරේ. ප්‍රති පෝෂණය සහ ඇගයීම ප්‍රධාන අංගයකි.

1 ක්‍රියාකාරකයින් සමඟ උපදේශනය

2 පවතින උපාදාන සමාලෝචනය - මාර්ගෝපදේශ මුල ධර්ම, අත්පොත, ක්ෂේත්‍ර පරිචය පිළිබඳ අත්පොත, මෙවලම් කට්ටලය ආදීන්.

3 අන්තර්ගතය ගොඩ නැගීම
- නැවත පැමිණීම, නැවත ඒකාබද්ධ කිරීම පිළිබඳ මුල ධර්ම
- සුළු ජාතීන්ගේ සුරක්ෂිතභාවය
- දේපල හිමි කරුවන්ට නැවත ලබා දීම
- වන්දි ගෙවීම් පිළිබඳ සහාය
- සහාය සැලසීමේ අවම සම්මතයන්
- අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්ගේ එම තත්ත්වය අවසන් කිරීමේ තීරණය ගැනීම
- සහභාගීත්ව සංවර්ධනය සහ ප්‍රජා සජීවීකරණය සහ ක්‍රියාත්මකවීම්

4. නිර්මාණ කණ්ඩායමක් කැඳවන්න.

5. අභ්‍යන්තර අවතැන්වීම් සඳහා වන බෲකින්ස් (Brookings) SAIS ව්‍යාපෘතිය වෙතින් උපදේශනය ලබාගන්න.

6. කියවන්නන් විසින් සමාලෝචනය කරන්න.

## දෙවන ඇමුණුම

## ක්‍රියාකාරකයින් සමග උපදේශනයන්

පෞද්ගලික සහ ඒකාබද්ධ රැස්වීම් :

1 ඒ. ජයරත්නම් මහතා - සරණාගතයින්, පුරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

2 ආර්. ධර්මකුලසිංහම් මහතා - වන්නි පුනරුත්ථාපන සහාය අමාත්‍යාංශය

3 එස්. සිවදාසන් මහතා - ලේකම්, පුනරුත්ථාපන අමාත්‍යාංශය, උතුරු හා නැගෙනහිර පළාත් සභාව

4 එන්. රවීන්ද්‍රන් මහතා - මානව හිමිකම් කොමිසම

5 අවුර්වාසි පටේල් මෙනෙවිය - ජ්‍යෙෂ්ඨ සුරැකුම් නිලධාරී, UNHCR

6 ලෝරන්ස් ක්‍රිස්ටි මහතා - දෙමල සහනාධාර සංවිධානය (TRO) කිලිනොච්චිය

7 කේ. ගනේෂ් මහතා - දිසාපති, වවුනියාව

8 එමෙල්ඩා සුකුමාර් - දිසාපති, මුලතිවු

9 ඒ. විස්වලිංගම් මහතා - දිසාපති, මන්නාරම

10 නියෝජිත - නැගෙනහිර සංවර්ධන අමාත්‍යාංශය හෝ නිලධාරී නැගෙනහිර සංවර්ධන අමාත්‍යාංශය

11 සෙල්වින් ඉරේනියස් මහතා - SIHRN අධ්‍යක්ෂ

12 බ්‍රැඩ්මන් වීරකෝන් මහතා - අගමැති ලේකම්

13 සෙල්හා සීනෝර් මෙනෙවිය - ජ්‍යෙෂ්ඨ සුරැකුම් උපදේශක - ඩෙන්මාර්ක සරණාගත කවුන්සිලය

14 වී. ත්‍යාගරාජා මහතා - සභාපති - NGO කවුන්සිලය - යාපනය

15 ජී. නරසිංහම් මහතා - සභාපති, NGO සංධානය, වවුනියාව

16 මෑතකදී පහත සඳහන් ප්‍රදේශවල යලි පදිංචි කරවනු ලැබූ අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින් සමඟ පැවැත්වූ රැස්වීම් සහ ක්ෂේත්‍ර චාරිකා

මන්නාරම

පුත්තලම

යාපනය

කිලිනොච්චිය

මඩකලපුව

වාලච්චේන

ත්‍රිකුණාමලය

වවුනියාව

අම්පාර